# පොදු නීතිරීති සහ කොන්දේසි

HSBC

PUBLIC

**පටුන**

**සියලුම ගිණුම් සඳහා**

**ඇතුළත්වීමේ ක්‍රියාදාමය**

තැන්පතු

කාලසීමා පදනම මත ප්‍රකාශන

**පවත්නා පාස්පොත් ඉතුරුම් ගිණුම් සඳහා පමණයි**

පොදු

පාස්පොත් ඉතුරුම් ගිණුම් වෙතින් මුදල් ආපසුගැනීම්

**ප්‍රකාශන ඉතුරුම් ගිණුම් සඳහා පමණයි**

ගිණුම් විවෘත කිරීම

පොලිය

**ජංගම ගිණුම් සඳහා පමණයි**

ගිණුම් විවෘත කිරීම

චෙක්පොත්

මුදල් ආපසුගැනීම්

**නියාමන ගිණුම් සඳහා පමණයි**

**කාල තැන්පතු ගිණුම් සඳහා පමණයි**

ගිණුම් විවෘත කිරීම

මුදල් ආපසුගැනීම්

පොලිය

**සියලුම ගිණුම් සඳහා පොදු නීතිරීති හා කොන්දේසි**

උපයෝගිතා බිල්පත් ගෙවීම්

ඇමතුම් මධ්‍යස්ථාන සේවාවන් හා ඇමතුම මධ්‍යස්ථාන හානිපූරණය

දුරකථන බැංකුකරණය සහ හානිපූරණය

බදු

පාලනය වන නීතිය හා අධිකරණ බලප්‍රදේශය

අදාළ වෙනත් පොදු වගන්ති

නීතිරීති සංශෝධනය කිරීම හා පිළිගැනීම

පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසි මගින්, ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සමග පවත්වාගෙන යන සියලුම රුපියල් ඉතුරුම් ගිණුම්/ජංගම ගිණුම්/ කාල තැන්පතු ගිණුම් පාලනය වනු ඇත.

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින අවසරලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් (මින් මතුවට "HSBC", "බැංකුව", "අප", "අපි", "අපගේ" යනුවෙන් හැඳින්වෙන අතර, සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුමෙන්, ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ එහි අනුප්‍රාප්තිකයන් සහ ලැබුම්කරුවන් ද ඇතුළත් වේ) බැංකුකරණ, ආයෝජන, මූල්‍ය හා වෙනත් ගනුදෙනු සහ විවිධාකාර ස්වභාවයේ ගනුදෙනු සිදුකිරීමේ කාර්යය සඳහා සහ, HSBC වෙතින් සහ/හෝ HSBC සමූහයෙහි සාමාජිකයින් වෙතින් සේවාවන්, සැලසුම්, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබාගැනීමට HSBC වෙත උපදෙස් ලබාදීමට හා සන්නිවේදනය කිරීමට ගිණුම් හිමියා/හිමියන්ට (මින් මතුවට "ගිණුම් හිමියා/හිමියන්", "ගනුදෙනුකරුවන්" , "ඔබ", "ඔබගේ", "ඔබලාගේ" යනුවෙන් හැඳින්වෙනු ඇති අතර, එම යෙදුමෙන් සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට ඔහුගේ/ඇයගේ උරුමකරුවන්/උරුමකාරියන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, පොල්මඃකරුවන් සහ නීත්‍යානුකූල නියෝජිතයන් ද අදහස් වන අතර ඇතුළත් වේ) හැකිවනු පිණිස මෙම නීතිරීති හා කොන්දේසි වලට (මින් මතුවට අර්ථනිරූපනය කර ඇත) යටත්ව කලින් කලට බැංකු සේවාවන්, පහසුකම් සහ තොරතුරු සපයනු ඇත.

මෙම නීතිරීති (මින් මතුවට දක්වා ඇත) මගින් ගිණුම් හිමියා/හිමියන් අප වෙතින් ඉල්ලා සිටින හෝ අප විසින් ගිණුම් හිමියා/හිමියන්ට සපයනු ලබන බැංකු සේවාවන්, පහසුකම් සහ තොරතුරු වලට අදාළව ගිණුම් හිමියා/හිමියන්ගේ වගකීම් සහ බැඳීම් පැහැදිලි කෙරේ.

ඉහත කී "HSBC" සහ "ගිණුම් හිමියා/හිමියන්" මින් මතුවට සමහර අවස්ථාවන් හි දී සාමූහිකව ලෙස මෙම ගිවිසුමෙහි "පාර්ශ්වකරුවන්" ලෙස ද තනි තනි වශයෙන් මෙම ගිවිසුමෙහි "පාර්ශ්වය" ලෙස ද හැඳින්වෙනු ඇත.



PUBLIC

අර්ථනිරූපනය:

මෙම නීතිරීති හා කොන්දේසිවල තද පැහැති ලොකු අකුරෙන් දක්වා ඇති යෙදුම් සඳහා, සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අවශ්‍ය නොකෙරෙන්නේ නම් පහත දැක්වෙන අර්ථ පවතිනු ඇත:

**"ගිණුම් හිමියා/හිමියන්"** ("ඔබ", "ඔබගේ", "ඔබලාගේ", "ගනුදෙනුකරු/ගනුදෙනුකරුවන්" යනුවෙන් ද සඳහන් වේ) යන්නෙන් අදහස් වන්නේ HSBC හි මුලින්ම විවෘත කර පවත්වාගෙන යන ලද ගිණුම විවෘත කිරීමේ අයදුම්පතෙහි නම්කර ඇති ගිණුම් හිමියා/හිමියන් ය.

**"ගිවිසුම"** යන්නෙන් අදහස් වන්නේ, මෙම ගිවිසුමෙහි කොටසක් බවට පත්වනු ඇති කලින් කලට පළ කෙරෙන සේවාවන් සැපයීම සඳහා වන යම් අතිරේක නීතිරීති ද ඇතුළත්ව, කලින් කලට මෙම ගිවිසුමේ නීතිරීති වලට අනුකූලව සංශෝධනය කෙරෙන මෙම නීතිරීති මාලාව ය.

**"ATM/s"**, යනුවෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අදහස් වේ. මෙම නීතිරීති සහ කොන්දේසි වලට අනුව කාඩ්පත භාවිත කිරීම මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාලයක කොටසක් සංයුක්ත කරනු ලබන (කාඩ්පත නිකුත් කරන ලද රට තුළ හෝ රටෙන් පිටත) යම් සමාන යන්ත්‍රයක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) යන යෙදුමට ඇතුළත් වේ.

**"බලධාරීන්'** යන්නෙන් අදහස් වන්නේ, HSBC සමූහයේ යම් කොටසක් මත අධිකරණ බලය පවතින යම් අධිකරණ, පරිපාලන, හෝ නියාමන ආයතනයක්, යම් රාජ්‍ය හෝ පොදු හෝ රජයේ නියෝජිත ආයතනයක් උපකාරී ආයතනයක් හෝ අධිකාරියක්, යම් බදු අධිකාරියක්, සුරැකුම් හෝ වස්තු හුවමාරු, අධිකරණ, මහ බැංකු හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් හෝ එහි නියෝජිතයෙකු වේ.

**"බැංකුකරණ දිනය"**/ **"සාමාන්‍ය බැංකුකරණ වේලාවන්"** සහ **"වැඩ කරන දින/පැය"** යන්නෙන් අදහස් වන්නේ, අප විසින් අන්‍යාකාරයකින් දක්වා නොමැති නම්, බැංකුකරණ/වැඩ කරන දින සහ සාමාන්‍ය බැංකුකරණ/වැඩ කරන පැය වේ.

**"කාඩ්පත් හිමියා"** යන්නෙන් අදහස් වන්නේ, HSBC සමග පවත්වාගෙන යනු ලබන ගිණුමක් හේතුවෙන් HSBC විසින් ඩෙබිට් කාඩ්පතක් නිකුත් කර ඇති යම් තැනැත්තකු වේ. කාඩ්පත් හිමියා පරම ගිණුම් හිමියා හෝ හවුල් ගිණුම් සම්බන්ධයෙන් වනවිට, හෝ තනිව ක්‍රියා කිරීම සඳහා බලය ලබා දුන් තැනැත්තා, පරම අත්සන්කරු විය යුතුය.



PUBLIC

**"**අනුකූලතා බැඳීම**"** යන්නෙන් අදහස් වන්නේ, (a) අදාළ යම් දේශීය හෝ විදේශීය නීතියක්, රෙගුලාසියක්, ආඥා පනතක්, රීතියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, ස්වෙච්ඡා ආචාරධර්ම පද්ධතියක්, නියමයක්, අනුමැති රෙජීමයක්, අධිකරණ තීන්දුවක්, HSBC සමූහයේ යම් සාමාජිකයෙකු හා යම් අධිකාරියක් අතර ඇති ගිවිසුමක්, හෝ HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුට අදාළ වන බලධාරීන් අතර පවතින යම් ගිවිසුමක් හෝ සම්මුතියක් (''නීති''), හෝ ජාත්‍යන්තර මගපෙන්වුමක් හා අභ්‍යන්තර ප්‍රතිපත්ති හෝ කාර්යපටිපාටි, (b) අධිකාරීන් වෙතින් ලැබෙන යම් (වලංගු) ඉල්ලීමක් හෝ වාර්තා කිරීමේ, නියාමන වෙළඳ වාර්තා කිරීමේ, හෙළිදරව් කිරීමේ හෝ නීති යටතේ පවතින වෙනත් යම් බැඳීමක් සහ (c) අපගේ ගනුදෙනුකරුවන්ගේ අනන්‍යතාව තහවුරු කරගැනීම සඳහා HSBC වෙත නියම කෙරෙන නීති වලට අනුකූලව ක්‍රියා කිරීමට HSBC සමූහයේ යම් සාමාජිකයෙකුගේ බැඳීමකි.

**"**රහස්‍ය තොරතුරු**"** යන්නෙන් අදහස් වන්නේ, හෙළිදරව් කරන අවස්ථාවේ දී රහස්‍ය ලෙස ගනුදෙනුකරුවෙකු විසින් නියම කර ඇති හෝ සාධාරණ පුද්ගලයෙකු විසින් රහස්‍ය, පොදු නොවන හෝ ස්වාභාවයෙන් හිමිකාරිත්වයක් සහිත ලෙසට සලකනු ඇති යම් තොරතුරක් වේ.

**"**සම්බන්ධිත තැනැත්තෙකු**"** යන්නෙන් අදහස් වන්නේ, ගනුදෙනුකරුවෙකු විසින් හෝ වෙනුවෙන් යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික දත්ත හෝ බදු තොරතුරු ඇතුළුව) සපයන්නේ ද නැතහොත් සේවාවන්ගේ ප්‍රතිපාදන හා සම්බන්ධයෙන් වෙනත් යම් ආකාරයකින් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත තොරතුරු ලැබෙන්නේ ද ඒ තැනැත්තා හෝ ආයතනය වේ. ගනුදෙනුකරුවා සම්බන්ධයෙන් සම්බන්ධිත තැනැත්තා යන්නට යම් (ගනුදෙනුකරුවාගේ) ඇපකරුවෙකු, සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධාරියෙකු, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු හෝ සාමාජිකයෙකු, යම් ''ප්‍රමාණාත්මක හිමිකරුවෙකු'', 'පාලක පුද්ගලයෙකු' හෝ අර්ථලාභී හිමිකරුවෙකු, භාරයක යම් භාරකරුවෙකු, දායකයෙකු හෝ ආරක්ෂකයෙකු, යම් නියම කළ ගිණුමක ගිණුම් හිමියෙකු, යම් නියම කළ ගෙවීමක ගෙවීම් ලබන්නෙකු, ගනුදෙනුකරු නියෝජනය කරන්නෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු හෝ, HSBC සමූහය සමග පවතින සිය බැංකු සබඳතාවකට අදාළ වන ගනුදෙනුකරු හා සම්බන්ධයක් පවතින වෙනත් යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

**"**පාලක පුද්ගලයන්**"** (සාමාන්‍යයෙන්) යන්නෙන් අදහස් වන්නේ, යම් ආයතනයක් මත පාලනය පවත්වාගෙන යන තනි පුද්ගලයන් (භාරයක් සම්බන්ධයෙන් නම් මෙම තැනැත්තන් වන්නේ දායකයා, භාරකරුවන්, ආරක්ෂකයා, අර්ථලාභීන් හෝ අර්ථලාභී කාණ්ඩය සහ භාරය මත අවසාන සඵල පාලනය ක්‍රියාත්මක කරන වෙනත් යම් පුද්ගලයෙකු ඇතුළත් වන අතර, භාරයක් හැර වෙනත් යම් නෛතික ආයතනයක් සම්බන්ධයෙන් ඊට සමාන තනතුරු හෝ පාලනය දරන පුද්ගලයන්) වේ.



PUBLIC

**"පාරිභෝගික තොරතුරු"** යන්නෙන් අදහස් වන්නේ, පුද්ගලික දත්ත, රහස්‍ය තොරතුරු සහ/හෝ ගනුදෙනුකරුගේ හෝ සම්බන්ධිත තැනැත්තෙකුගේ බදු තොරතුරු (ඊට අදාළ ප්‍රකාශන, අතහැරීම් හා කැමැත්ත පළකිරීම් ද ඇතුළත්ව) වේ.

**"ඩෙබිට් කාඩ්පත"** හෝ **"කාඩ්පත"** යන්නෙන් අදහස් වන්නේ, HSBC විසින් යම් කාඩ්පත් හිමියකුට නිකුත් කරන ලද දේශීය/ජාත්‍යන්තර වශයෙන් වලංගු උචිත ඩෙබිට් කාඩ්පතක් වේ.

**"ESPM/s"** යන්නෙන් අදහස් වන්නේ, බැංකුවේ EasyPay යන්ත්‍ර වේ.

**"**මූල්‍ය අපරාධ' යන්නෙන් අදහස් වන්නේ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, අල්ලස්, දූෂණ, බදු මගහැරීම්, වංචා, ආර්ථික හෝ වෙළඳ සම්බාධක මගහැරීම් සහ හෝ මෙම කාරණා වලට අදාළව ඇති යම් නීති හෝ රෙගුලාසි කඩකිරීම් හෝ මගහැරීමට හෝ කඩකිරීමට උත්සාහ කිරීම් වේ.

**"HSBC"** ("බැංකුව", "අප", "අපි", "අපගේ" යනුවෙන් ද හැඳින්වෙන) යන්නෙන් අදහස් වන්නේ, හොංකොං SAR නීති මගින් සහ නීති යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති බැංකු සංස්ථාවක් වූ ද, ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 1 ක්වීන්ස් පාර, සෙන්ට්‍රල්, හොංකොං යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 24 දරන ස්ථානයේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙනත් ස්ථානවල ශාඛා පිහිටා ඇත්තා වූ ද එකී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන්නා වූ ද ("HSBC" හෙවත් බැංකුව, යනුවෙන් හඳුන්වනු ලබන බැංකුව සහ ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම් ලාභීන්ද ඇතුළත් වන) ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් යන ආයතනය වේ.

**"HSBC** සමූහය**"** යන්නෙන් අදහස් වන්නේ, HSBC හෝල්ඩින්ස් පීඑල්සී සහ එහි උප-ආයතන හා සහයෝගී ව්‍යාපෘති සහ එහි ඕනෑම ශාඛාවක් සහ "**HSBC** සමූහයේ ඕනෑම සාමාජිකයකු" වේ.

**"තොරතුරු"** යන්නෙන් අදහස් වන්නේ, අප විසින් හෝ යම් තොරතුරු සපයන්නෙකු විසින් හෝ සපයන ලද සහ ගිණුම් හිමියා/හිමියන් වෙත ලැබෙන්නට සලස්වන ලද මූල්‍ය, වෙළඳපොළ හෝ වෙනත් තොරතුරු සහ දත්ත ය.

**"තොරතුරු සපයන්නා"** යන්නෙන් අදහස් වන්නේ, HSBC හැර, තොරතුරු සපයන්නෙකුට යම් තොරතුරක් සපයන තැනැත්තෙකු ද ඇතුළත්ව, එහෙත් ඊට සීමා නොවී, තොරතුරු සපයන ඕනෑම තැනැත්තෙකි.

**"ආයතනය"** යන්නෙන් අදහස් වන්නේ, අදාළ පරිදි සාමූහිකව හෝ තනිව මෙම ගිවිසුමේ අරමුණු සඳහා ආයතනයක් ලෙස සැලකිය යුතු බවට ගිණුම් හිමියා/හිමියන් විසින් HSBC වෙත දැනුම් දී ඇති ඕනෑම තෙවන පාර්ශ්වයක මූල්‍ය ආයතනයකි.

**"උපදෙස්"** යන්නෙන් අදහස් වන්නේ, ගිණුම් හිමියා/හිමියන් වෙතින් HSBC වෙත ලැබෙන නිසි ලෙස බලයලත් ලිඛිත ඉල්ලීම් හෝ උපදෙස් ය.

**"ජාත්‍යන්තර ගනුදෙනු"** යන්නෙන් අදහස් වන්නේ, ශ්‍රී ලංකාවෙන් පිටත HSBC ශාඛාවලින් කාඩ්පත් හිමියා විසින් සිදුකරනු ලබන සියලු ගනුදෙනු ය.

**"හවුල් ගිණුම් හිමියා/හිමියන්"** යන්නෙන් අදහස් වන්නේ, හවුල් ව සහ/හෝ වෙන වෙන ම එක් ගිණුම් හිමියෙකුට වැඩි ගිණුම් හිමියන් සංඛ්‍යාවක් ය.

**"හානිය"** යන්නෙන් අදහස් වන්නේ, කවර ආකාරයකින් හෝ ගණනය කෙරෙන හෝ සිදුවන යම් අයැදීමක්, අයකිරීමක්, පිරිවැයක් (නීතිමය හෝ වෙනත් වෘත්තීමය ගාස්තු ද ඇතුළත් ව නමුත්, ඊට සීමා නොවී) එය සෘජු හෝ වක්‍ර, ආනුෂංගික, දණ්ඩනීය හෝ අවස්ථානුකූල වුවද, හානියක්, ණයක්, වියදමක්, බදු මුදලක්, වගකීමක්, බැඳීමක්, චෝදනාවක්, නඩුවක්, නඩුකරයක්, ඉල්ලීමක්, නඩු නිමිත්තක්, නඩු කටයුත්තක් හෝ නඩු තීන්දුවක් වේ.

**"වෙළඳ ආයතන"** යන්නෙන් අදහස් වන්නේ, ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන ඕනෑම ස්ථානයක පිහිටි වෙළඳ ආයතන වන අතර, වෙනත් ස්ථාන අතර එයට HSBC හෝ VISA Worldwide Pte Limited විසින් ප්‍රචාරය ලබාදී ඇති ගබඩා, සාප්පු, අවන්හල්, ගුවන්සේවා සමාගම් යනාදිය ඇතුළත් වේ.

**"මුරපදය"** යන්නෙන් අදහස් වන්නේ, බැංකුව විසින් ගිණුම් හිමියා/හිමියන් වෙත නිකුත් කර ඇති ATM යන්ත්‍ර කාඩ්පතක්, ඩෙබිට් කාඩ්පතක් සහ ක්‍රෙඩිට් කාඩ්පතක් ද ඇතුළත් ව ඊට සීමා නොවී, උපයෝගී කරගනිමින්, උපදෙස් වලට ප්‍රවේශවීමට හෝ ක්‍රියාත්මක කරවීම සඳහා හෝ දුරකථන බැංකුකරණය, PIB හරහා ගනුදෙනු සිදු කිරීමට සැකසූ රහසිගත වචනයක්, යෙදුමක්, මූලික ඉලක්කම් වලින් සමන්විත අංකයක් වේ.

**"පෞද්ගලික දත්ත"** යන්නෙන් අදහස් වන්නේ, යම් තැනැත්තෙකුට (සහ දත්ත පෞද්ගලිකත්ව නීති වාණිජ ආයතන වලට ද අදාළ වන රටවල වාණිජ ආයතන වලට) අදාළ වන එම තැනැත්තා හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ, සංවේදී පෞද්ගලික දත්ත, නම(නම්), නේවාසික ලිපිනය(ලිපින), ඇමතුම් තොරතුරු, වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය, පුරවැසි භාවය පෞද්ගලික හා වෛවාහික තත්ත්වය ද ඇතුළත්ව, ඊට සීමා නොවී, ඕනෑම දත්තයක් වේ.



PUBLIC

**"**පෞද්ගලික අන්තර්ජාල බැංකුකරණය**"** **(PIB)** යන්නෙන් අදහස් වන්නේ, HSBC හි ගිණුම් හිමියා/හිමියන්ට උපදෙස් වලට ප්‍රවේශවීමට හෝ ක්‍රියාත්මක කරවීමට හෝ ගනුදෙනු සිදු කිරීමට HSBC හි නිල වෙබ් අඩවිය හරහා ලබාගත හැකි ජාල මාර්ගයකි.

**"**මූලික ගිණුම**"** යන්නෙන් ඩෙබිට් කාඩ්පතට සම්බන්ධ කර ඇති බහුවිධ ගිණුම් සම්බන්ධයෙන් වනවිට උදාහරණයක් වශයෙන් මිලදී ගැනීම් ගනුදෙනු, ඩෙබිට් කාඩ්පතට අදාළ ගාස්තු සහ අයකිරීම් හරකරනු ලැබිය යුතු ගිණුම වන්නා වූ ප්‍රධාන/පළමු ක්‍රියාත්මක ගිණුම වශයෙන් නම් කර ඇති ගිණුම අදහස් වේ.

**"**සේවාවන්**"** යන්නෙන් (a) ගනුදෙනුකරුගේ බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම (b) ණය පහසුකම් හා වෙනත් බැංකුකරණ සැලසුම් හා සේවාවන් ගනුදෙනුකරුට සැපයීම (උදාහරණ ලෙස, වස්තුභාර ගනුදෙනු, ආයෝජන උපදෙස්, තැරැව්කාර සේවා, නියෝජිත සේවා, භාරකාරත්ව, නිෂ්කාශන හෝ තාක්ෂණය ලබාගැනීමේ ප්‍රසම්පාදන සේවාවන් ද ඇතුළත් ව), අයදුම්පත් සැකසුම, අතිරේක ණය තක්සේරු හා නිෂ්පාදන සුදුසුකම් තක්සේරු සහ (c) මූල්‍ය සේවා හෝ ඊට සම්බන්ධ සැලසුම් ගනුදෙනුකරු වෙත අලෙවිකරණය හෝ ප්‍රවර්ධනය, අලෙවි සමීක්ෂණ, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද ඇතුළත්ව ගනුදෙනුකරුවා සමග HSBC හි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම, ඊට සීමා නොවී, අදහස් වේ.

**"**ප්‍රකාශන**"** යන්නෙන් අදහස් වන්නේ, HSBC විසින් ගිණුම් හිමියා/හිමියන්ට දෙන ලද යම් කාලසීමාවක් තුළ ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනු (ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු ඇතුළුව) පිළිබඳව සහ එම ගිණුමේ ශේෂය සඳහන් කරමින් එවනු ලබන වාර ප්‍රකාශනයකි. HSBC විසින් ඇතුළත් කිරීම සුදුසු යැයි සලකන වෙනත් තොරතුරු ද එහි ඇතුළත් විය හැකිය.

**"**ප්‍රාමාණික හිමිකරුවෙකු**"** යන්නෙන් අදහස් වන්නේ, යම් ආයතනයක ලාභයෙන් 10%ක ට වඩා හිමිකම් දරන හෝ සෘජුව හෝ වක්‍ර ව 10%ක ට වඩා අයිතිය ලබන තැනැත්තෙකු වේ.

**"**බදු අධිකාරීන්**"** යන්නෙන් අදහස් වන්නේ, දේශීය හෝ විදේශීය බදු, ආදායම්, රාජ්‍ය මූල්‍ය හෝ මුදල් අධිකාරීන් ය.

**"**බදු තොරතුරු**"** යන්නෙන් අදහස් වන්නේ, ගනුදෙනුකරුවෙකුගේ (එම ගනුදෙනුකරු පුද්ගලයෙකු හෝ ලාභ නොලබන හෝ වෙනත් වාණිජ ආයතනයක් වන ව්‍යාපාරයක් වුවද, ඒ බව නොසලකා) සහ සාධාරණව ක්‍රියා කිරීමේ දී යම් බදු අධිකාරියක් වෙත ඇති යම් HSBC සමූහ සාමාජිකයෙකුගේ බැඳීම්

වලට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය යැයි HSBC විසින් සලකනු ලබන යම් හිමිකරුවෙකු, ''පාලක පුද්ගලයෙකු'' ''ප්‍රාමාණික හිමිකරුවෙකු'' හෝ ගනුදෙනුකරුවෙකුගේ අර්ථලාභී හිමිකරුවෙකුගේ බදු තත්ත්වයට සෘජුව හෝ වක්‍රව අදාළ වන යම් ලේඛනයක් හෝ තොරතුරක් වේ.

**"**බදු තොරතුරු**"** යන්නටː බදු නේවාසිකත්වය සහ/හෝ ආයතනයේ ස්ථානය (අදාළ පරිදි), බදු වාසය, බදු හඳුනාගැනීමේ අංකය, බදු සහතික කිරීමේ ආකෘති පත්‍ර, {නම(නම්), නේවාසික ලිපිනය(ලිපින), වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය හා පුරවැසි භාවය ද ඇතුළත් ව} ආදී පෞද්ගලික දත්ත පිළිබඳ තොරතුරු ඇතුළත් වන නමුත් ඊට සීමා නොවේ.

**"**බදු සහතික කිරීමේ ආකෘතිපත්‍ර**"** යන්නෙන් අදහස් වන්නේ, ගිණුම් හිමියෙකුගේ හෝ ආයතනයක සම්බන්ධිත පුද්ගලයෙකුගේ බදු තත්ත්වය තහවුරු කිරීම සඳහා බදු අධිකාරීන් හෝ HSBC විසින් කලින් කලට නිකුත් කරන හෝ නියම කරන හෝ ඕනෑම ආකෘති පත්‍රයක් හෝ ලේඛනයක් වේ.

ඒකවචන යෙදුම් වලට බහුවචන යෙදුම් ද (ප්‍රතිලෝම වශයෙන් ද) ඇතුළත් වේ.

**"**නීතිරීති සහ කොන්දේසි**"** යන්නෙන් අදහස් වන්නේ, මෙම ගිවිසුම පාලනය වන නීතිරීති සහ කොන්දේසි, යම් මුක්තිප්‍රකාශ, අන්තර්ජාල පෞද්ගලිකත්ව පිළිබඳ ප්‍රකාශන, මගපෙන්වුම් වන අතර, එයට, කලින් කලට සංශෝධනය කෙරෙන පරිදි අප විසින් ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දෙන යම් අතිරේක නීතිරීති ද ඇතුළත් වන අතර, ඊට සීමා නොවේ.

**"**ගනුදෙනුව/ගනුදෙනු**"** යන්නෙන් අදහස් වන්නේ, ගිණුම් හිමියා විසින් ලිඛිතව හෝ ඩෙබිට් කාඩ්පතක් මගින් ගිණුම සම්බන්ධයෙන් (මුදල්/චෙක්පත් තැන්පතු ආදිය උදාහරණ වේ) අවසරලත් ක්‍රියාවක් සිදු කිරීමට HSBC වෙත ලබාදෙන අවසරලත් ඕනෑම උපදෙසකි. මෙහිදී හවුල් ගිණුම් හිමියන් සාමූහිකව ''ගිණුම් හිමියා/හිමියන්'' ලෙස හැඳින්වෙනු ඇත.

පද භාවිතය ''ඔබ'', ''ඔබගේ'', ''ඔහුට'', හෝ සමාන සර්ව නාම පද භාවිතය මගින් එසේ පිළිගනු ලබන අවස්ථාවල දී උචිත ලෙස ගිණුම් හිමියා හෝ කාඩ්පත් හිමියා අදහස් කරනු ලැබිය යුතු ය. පුරුෂ ලිංග වචන සඳහා වූ සියලු සඳහන් කිරීම් මගින් ස්ත්‍රී ලිංග වචන ද ඇතුළත් වන්නේ ය.

**"VISA"** යන්නෙන් අදහස් වන්නේ, VISA Worldwide Pte Limited විසින් සන්තකය දරනු ලබන ලකුණක් වේ.

**"VISA ATM** ජාලය**"** යන්නෙන් අදහස් වන්නේ, ඩෙබිට් කාඩ්පත පිළිගනු ලබන සහ VISA හෝ ඉලෙක්ට්‍රොන් සංකේත ප්‍රදර්ශනය කරනු ලබන ATM යන්ත්‍ර වේ.

**සියලුම ගිණුම් සඳහා**

1. **ඇතුළත්වීමේ ක්‍රියාදාමය**

1.1 දෙන ලද නේවාසික ලිපිනය තහවුරු කරගැනීම සඳහා, ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය වැනි ලේඛනයක්/ලේඛන ඇතුළුව, නමුත් ඊට සීමා නොවී, බැංකුවට පිළිගත හැකි ධනාත්මක හඳුනාගැනීමකින් පසුව බැංකුව විසින් අනුමත කළ තැනැත්තෙකු/තැනැත්තන් විසින් ඉතුරුම් ගිණුමක්, ජංගම ගිණුමක්, සහ කාල තැන්පතුවක් විවෘත කළ හැකිය.

1.2 ඉතුරුම් ගිණුම (ගිණුම්), ජංගම ගිණුම (ගිණුම්), සහ කාල තැන්පතුව (තැන්පතු) (මින් මතුවට තනිව ''ගිණුම'' යනුවෙන් හෝ පොදුවේ ''ගිණුම්'' යනුවෙන් හැඳින්වෙනු ඇත) පහත තැනැත්තන්ට විවෘත කළ හැකිය.

1.2.1 පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ නමින්;

1.2.2 ගිණුම් හිමියා/හිමියන් විසින් බැංකුව වෙත ලබාදෙන මැන්ඩේටයට අනුකූලව එක් අයෙකුට හෝ සියලුදෙනාටම ගෙවිය හැකිවීමට යටත්ව, පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු විසින් හවුලේ ඔවුන්ගේ නමින්.

1.3 සෑම ගිණුමකටම විශේෂිත අංකයක් ලබාදෙනු ඇති අතර, බැංකුව සමග සිදුකරන සියලුම පණිවුඩ හුවමාරුවල දී සහ සියලුම ගෙවීමේ පත්‍රිකා වල සහ මුදල් ආපසු ගැනීමේ ආකෘති පත්‍ර වල එය සඳහන් කළ යුතුය.

1.4 ගිණුම් කළඹට අදාළ අවම ශේෂය පිළිබඳ අවශ්‍යතාව රු. 100,000/-ක් හෝ වෙනත් ඕනෑම නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වටිනාකමකින් යුතු විය අතර, එය කලින් කලට වෙනස් විය හැකි අතර, එකී වෙනස්වීම් බැංකුව විසින් එහි ශ්‍රී ලංකාවේ ශාඛාවල සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk ප්‍රදර්ශනය කිරීම මගින් ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දෙනු ඇත. ගිණුම් හිමියා/හිමියන් විසින් එකී අවම ශේෂය පවත්වා නොගන්නේ නම්, බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, මාසිකව, බැංකුවෙහි පවත්නා ගාස්තු අයකුම ලේඛනය යටතේ එම ගිණුම් මත ගනුදෙනු ගාස්තු සහ/හෝ සේවා ගාස්තු (අඩු ශේෂ ගාස්තුව හෝ BBF) අයකරනු ඇත. නිර්ණායක අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය කෙරෙන අදාළ මාසය සඳහා වන ගාස්තු ඊළඟට එළඹෙන මාසයේ දී හර කෙරෙනු ඇත.

1.5 විවෘත කර ඇති සියලුම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති මුදල් වර්ගය/වර්ග වලින් සහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුව පවතිනු ඇත.

1.6 බැංකුව විසින් ක්‍රියාකරනු ඇත්තේ බැංකුව වෙත ලබා දෙන ලද මැන්ඩේටයට අනුකූලව බලයලත් ගිණුම් හිමියා/හිමියන්ගේ ගිණුම හර කරමින් ගෙවීම් සිදුකරන ලෙසට ලැබෙන තහවුරු කරගත් ලිඛිත උපදෙස් (නිත්‍ය උපදෙස් ඇතුළත්ව) මත පමණකි.

1.7 බැංකුවේ අභිමතය මත පිරිනමනු ඇති පහසුකමක් සඳහා, බැංකුව වෙත ගිණුම් හිමියා/හිමියන් විසින් ඉදිරිපත් කරනු ලබන හානිපූරණ ලිපියකින් තොරව ෆැක්ස් හෝ වෙනත් යම් විද්‍යුත් මාධ්‍යයක් හරහා ලබාදෙන උපදෙස් මත බැංකුව විසින් ක්‍රියා නොකරනු ඇත.

## 2. **තැන්පතු**

2.1 කැමති පරිදි ඕනෑම වාර ගණනක් තැන්පතු සිදුකළ හැකිය. කවුන්ටරවල දී සිදුකරන තැන්පතු, තැන්පතු පත්‍රිකාව වලංගු කිරීමක් මගින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් තැන්පතු පත්‍රිකාව අත්සන් කිරීම මගින් භෞතිකව වලංගු කිරීම මගින් හෝ පිළිගැනෙනු ඇත.

2.2 බැංකුව වෙත යොමුකර නොමැති විදේශ ව්‍යවහාර මුදල් අණකර සහ වෙනත් ගෙවීම් අණකර මිලදී ගැනීම හෝ එකතු කිරීම සඳහා පැවරීම සිදුකරන්නේ ද නැද්ද යන වග බැංකුව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇත. ගෙවීම් කිරීමේ බැංකුව විසින් පසුව අගරු කිරීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී මිලදී ගනු ලැබූ සියලු අයිතම පිළිබඳ (ගාස්තු ද ඇතුළුව) කිසිදු වගකීමකට බැංකුව බැඳී නොසිටියි. අගරුවීමේ දැන්වීම බැංකුව වෙත ලැබුණු පසුව ගිණුම හර කෙරෙනු ඇත.

2.3 ගිණුම් වලට බැර කරන චෙක්පත් භාරගනු ලබන්නේ එකතු කරගැනීම සඳහා පමණක් වන අතර, ගෙවන බැංකුව විසින් නිෂ්කාශනය කරන තෙක් මුදල් ලබාගැනීමට නොහැකි වනු ඇත. අරමුදල් පවතින දිනය පෙන්නුම් කරනුයේ ඇගැවීමේ කාර්යය සඳහා පමණකි. මෙම නීතිරීති සහ කොන්දේසි නොතකා, ඉතුරුම් ගිණුම් වන ගිණුම් චෙක්පත් එකතු කරගැනීම හා නිෂ්කාශනය කිරීම සඳහා යොදා නොගන්නා අතර, චෙක්පත්, ලාභාංශ බලපත්, සහ දරන්නා, තැන්පත්කරු හෝ තෙවන පාර්ශ්වයක් වෙත ගෙවිය යුතු වන සේ ලියන ලද වෙනත් ලේඛන තැන්පත් කිරීම සඳහා භාරගැනීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

2.4 නිෂ්කාශනය/එකතු කරගැනීම සඳහා තැන්පත් කරන ලද වෙනත් බැංකු වෙත ලියන ලද රුපියල් චෙක්පත් ලංකා ක්ලියර් පුද්ගලික සමාගම ("Lanka Clear Private Limited – LCPL") හි රීති වලට යටත් වනු ඇති අතර, කලින් කලට සංශෝධනය කෙරෙනු ඇත. මුදල් ගෙවන බැංකුව විසින් අය කරන යම් කොමිස් මුදලක් හෝ ගාස්තුවක් බැංකුවේ පරම අභිමතය පරිදි අධිභාරයක් සහිතව හෝ රහිතව අදාළ ගිණුමෙන් හෝ වෙනත් යම් ගිණුමකින් හෝ හර කෙරෙනු ඇත.

2.5 විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පත් කිරීම් වල දී, මුදල් නෝට්ටු වලට හා ටෙලිග්‍රාෆ් හුවමාරු වලට අදාළ වන විනිමය අනුපාතයෙහි වෙනස්වීම් හේතුවෙන් තැන්පත් කරන ලද නෝට්ටුවකට ඇති වටිනාකමෙහි අඩුවීමක් සිදුවිය හැක.

2.6 බැංකුව වෙත ලියන ලද අණකර/චෙක්පත් යම් ගිණුමක් වෙත ගෙවන විට, බැංකුව විසින් පළ කර ඇති ගාස්තු හා අයකිරීම් වලට අනුකූලව හැසිරවීමේ ගාස්තු අඩු කරනු ඇත.

2.7 බැංකුව විසින් කලින් කලට පනවන හෝ 2.10 වගන්තියේ දක්වා ඇති සීමාවන් දක්වා (ගිණුම් හිමියාගේ නමින් පමණක් ලියන ලද මුදල් හෝ චෙක්පත්) ATM යන්ත්‍ර හා ESPM යන්ත්‍ර හරහා කැමති පරිදි ඕනෑම වාර ගණනක් තැන්පතු සිදුකළ හැකිය. සියලුම තැන්පතු ATM යන්ත්‍ර හා ESPM යන්ත්‍ර හරහා ලබා දෙන තාවකාලික ලදුපතක් සහිත වලංගු කිරීමක් මගින් පිළිගැනෙනු ඇත.

2.8 තැන්පත් කරන ලද චෙක්පත් (ඇත්නම්) ඒවායේ මුදල්, ගිණුම් හිමියාගේ ගිණුමට බැර කර ඇත්නම් හැර, ESPMs හෝ ATM යන්ත්‍ර හරහා (තාවකාලික ලදුපතක් නිකුත් කර තිබුණේ වුවද ඒ බව නොසලකා) තැන්පත් කරන ලදැයි කියන යම් චෙක්පත් සම්බන්ධයෙන් බැංකුව ගිණුම් හිමියා වෙත වගකීමට බැඳී නොමැත. (ESPMs) /ATM යන්ත්‍ර මගින් නිකුත් කරන තාවකාලික ලදුපත් නොසලකා, (ESPMs) / ATM යන්ත්‍රවල තැන්පත් කර ඇතැයි කියන චෙක්පත් සම්බන්ධයෙන්, එකී චෙක්පත් ගිණුමට බැර කර ඇත්නම් හැර, කිසිදු තත්ත්වයක් යටතේ හෝ කිසිදු හේතුවක් නිසා හෝ බැංකුව විසින් කිසිදු අයැදීමක් භාර නොගනු ඇත.

2.9 යම් වරදකින්, ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් බැංකුව විසින් ගිණුම් හිමියා/ හිමියන්ගේ ගිණුමට මුදල් බැරකරන විටකදී, ඕනෑම අදියරක දී සහ/හෝ ඕනෑම වේලාවක දී එකී ඇතුළත් කිරීම ආපසු හැරවීමට සහ/හෝ ඉන් පසුව ගිණුම් හිමියා/හිමියන් වෙතින් එම මුදල ඉල්ලා සිටීමට බැංකුවට ඕනෑම අවස්ථාවක අයිතිය පවතිනු ඇත.

2.10 බැංකුවේ ශාඛා වල කවුන්ටර මගින් රු.200,000/-ට අඩු වටිනාකමින් යුත් මුදල් තැන්පතු (ESPMs) /ATM යන්ත්‍රවල තැන්පත් කළ හැකි උපරිම මුදල් සීමාව වන මෙය කලින් කලට වෙනස්වීමට යටත් වේ) සහ ATM සීමාවට (හෝ කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ඇති වෙනත් යම් මුදලකට) වඩා අඩු මුදල් ආපසු ගැනීම් සඳහා බැංකුව විසින් කලින් කලට තීරණය කර ප්‍රකාශිත අය කිරීම් හා ගාස්තු වලට අනුකූලව අය කිරීම් වලට යටත් වනු ඇත. සංශෝධිත අය කිරීම් සියලුම ශාඛාවල සහ බැංකුවේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙතින් ලබාගත හැකිවනු ඇත. මාසයක් තුළ අය කිරීම් ඊළඟ මාසයේ පළමු සිකුරාදා දිනට පසුව එළඹෙන ඊළඟ වැඩ කරන දිනයේ දී හෝ බැංකුව විසින් තීරණය කරන වෙනත් යම් දිනයක දී හෝ ගිණුමට හර කෙරෙනු ඇත.

## 3. වාර ගිණුම් ප්‍රකාශන

3.1 ගිණුමෙහි ගනුදෙනු (ඩෙබිට් කාඩ්පත භාවිතයෙන් ගිණුම් හිමියා/හිමියන් විසින් සිදු කරන ලද ගනුදෙනු ද ඇතුළත්ව) සම්බන්ධ සියලුම වාර්තා බැංකුව විසින් එවන ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් වනු ඇත. මෙම නීතිරීති වලට අනුකූලව එම ගිණුම් ප්‍රකාශන ගිණුම් හිමියා විසින් බැංකුව වෙත උපදෙස් ලබා දී ඇති පරිදි, බැංකුවෙහි ඇති තැපැල් ලිපිනය වෙත කාලීන පදනමින් ගිණුම් හිමියා/හිමියන් වෙත තැපෑලෙන් එවනු ලැබේ.

3.2 ගිණුම් හිමියා/හිමියන් විසින් නිසි පරිදි යම් අක්‍රීය ගිණුමක් ලිඛිතව සක්‍රීය කරනු ලබන තෙක්, යම් අක්‍රීය ගිණුමක් සම්බන්ධයෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත ගිණුම් ප්‍රකාශන නොලැබෙනු ඇත.

3.3

3.3.1 සෑම ගිණුම් ප්‍රකාශනයක්ම ලද වහාම, ඕනෑම අවස්ථාවක දී ගිණුම් ප්‍රකාශනය ගිණුම් හිමියා වෙත ලැබෙන්නට ඇතැයි සලකන දිනයේ සිට ලිත් දින විස්ස (20)ක ට නොඅඩු කාලසීමාවක දී ගිණුම් ප්‍රකාශනයේ දැක්වෙන සෑම ඇතුළත් කිරීමක්ම ("නිරීක්ෂණය") පරීක්ෂා කර තහවුරු කිරීමට ද, ඒවා ගිණුම් හිමියාගේම වාර්තා සමග සසඳා බැලීමට ද, යම් වංචනික හෝ අනවසර ගනුදෙනු ද ඇතුළත්ව යම් වරදක්, අතහැරීමක්, අක්‍රමිකතාවක් හෝ එකී ගිණුම් ප්‍රකාශනයට ගිණුම් හිමියාගේ වෙනත් ඕනෑම විරෝධතාවක් (සමස්තයක් ලෙස "ගිණුම් අක්‍රමිකතා") පවතී නම්, ලිඛිතව බැංකුව වෙත වහාම දැනුම්දීමට ද ගිණුම් හිමියා එකඟ වෙයි. නිරීක්ෂණ කාලසීමාවේ දී බැංකුව වෙත දැනුම්දීමට ගිණුම් හිමියා අපොහොසත් වුවහොත්, ගිණුම්

ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය සහ ගිණුම ද ඇතුළත්ව එහි ඇති සියලුම ඇතුළත් කිරීම් නිවැරදි, සම්පූර්ණ, අවසරලත් සහ ගිණුම් හිමියා/හිමියන් මත බන්ධනීය ලෙස සැලකෙනු ඇති අතර, මෙම වගන්තියට අනුකූලව ගිණුම් හිමියා/හිමියන් විසින් දැනුම්දීමක් සිදුකර ඇති ගනුදෙනු සම්බන්ධයෙන් හැර ඉතාම මෑත ගිණුම් ප්‍රකාශනයේ දිනය දක්වා සිදුව ඇති සියලුම ගනුදෙනු සඳහා වන ඕනෑම වගකීමකින් බැංකුව නිදහස් කෙරෙනු ඇත.

3.3.2 වෙනත් ස්ථානයක සඳහන් කර ඇති ප්‍රතිවිපාක වලට අතිරේකව, ඉහත 3.3.1 වගන්තියේ සඳහන් වගකීම් මගින් බැඳී සිටීමට ගිණුම් හිමියා/හිමියන් අපොහොසත් වන්නේ නම්, සහ ගිණුම් හිමියාගේ චර්යාව හෝ නොකර හැරීමක් මගින් සිය ගිණුමට අලාභයක් (ඕනෑම ආකාරයක අලාභයක්, බැංකුවට දරන්නට සහ/හෝ අත්විඳින්නට සිදුවන හෝ බැංකුවට එරෙහිව පැනවෙන බදු, අයකිරීම්, දඩ, ගාස්තු, හෝ දඬුවම් ගාස්තු) සිදු වේ නම් හෝ දායක වේ නම්, එවිට එවැනි අලාභයන් සම්බන්ධයෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුවෙහි කිසිදු වගකීමක් නොපවතිනු ඇති බවට ගිණුම් හිමියා/හිමියන් එකඟ වේ. මෙම ගිවිසුමට අනුකූලව අවශ්‍ය පරිදි කාලීන ආකාරයෙන් ගිණුම් ප්‍රකාශනය නිරීක්ෂණය කිරීමට අසමත්වීම මගින්, ගිණුම් ප්‍රකාශනය මෙම නීතිරීති සහ කොන්දේසි වලට අනුකූලව සමාලෝචනය කර තිබුණේ නම් වැරදි හෝ අතපසුවීම් සොයාගත හැකිව තිබූ කාලයට පසුව සිදුවන යම් අලාභයක ප්‍රමාණයට ගිණුමට අලාභයක් සිදුකර හෝ ඊට දායක වී ඇති බවට සැලකෙනු ඇති බවට ගිණුම් හිමියා/හිමියන් පිළිගනියි. ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුවේ පවතින උපරිම වගකීම බැංකුවේ හුදු නොසැලකිල්ල හෝ චේතනාන්විත විෂමාචාරය හේතුවෙන් ගිණුම් හිමියාගේ ගිණුමෙන් වැරදි ලෙස හෝ වරදවා ඉවත් කරන ලද මූලික මුදලෙහි සත්‍ය සෘජු අලාභයන්ට පමණක් සීමා වනු ඇති බවට ගිණුම් හිමියා/හිමියන් පිළිගනියි.

3.4 අගතියට පත් ගිණුම් හිමියෙකුගේ ප්‍රකාශනයේ දක්වා ඇති ගනුදෙනුවක් සම්බන්ධයෙන් එකඟ නොවීමක් හෝ වෙනත් ආකාරයකින් ගිණුම් හිමියා/හිමියන් විසින් නිශ්චය කරන කරුණු විසඳීම සඳහා, එවැනි එකඟ නොවීමක් පිළිබඳ දැන්වීමක් ලැබීමෙන් පසුව මාස දෙකක් තුළ බැංකුව විසින් සද්භාවයෙන් හා සාධාරණ උත්සාහයන් දරනු ඇත. එවැනි උත්සාහයකට පසුව ද, එම ගනුදෙනුව වලංගු එකක් බවට HSBC විසින් තීරණය කරයි නම්, ඒ බව ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දෙනු ඇත.

**පවතින පාස්පොත් ඉතුරුම් ගිණුම් සඳහා පමණයි**

4. **සාමාන්‍ය**

4.1 බැංකුව විසින් ගිණුම් හිමියා/හිමියන් වෙත සපයන පාස්පොත ගිණුම් හිමියා/හිමියන් විසින් ප්‍රවේශමෙන් රැකගත යුතු වේ.

4.2 පාස්පොත නැතිවුවහොත් හෝ විනාශ වුවහොත් හෝ ගිණුම් හිමියා/හිමියන් විසින් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු වේ. ගිණුම් හිමියා/හිමියන් අතින් පාස්පොත නැතිවීමක් හෝ විනාශවීමක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමකට බැඳී නැති අතර, එවැනි අවස්ථාවක දී බැංකුව වෙත හානිපූරණ ලිපියක් ලබා දෙන ලෙස බැංකුව විසින් ගිණුම් හිමියා/හිමියන්ගෙන් ඉල්ලා සිටිනු ඇත.

4.3 ගිණුම් හිමියා/හිමියන් විසින් පාස්පොත මත කිසිදු ඇතුළත් කිරීමක් නොකළ යුතු අතර, එය අවශ්‍ය විටෙක බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එය වෙනත් කෙනෙකුට පැවරීමට හෝ භාර කිරීමට හෝ නොහැකි අතර, සුරක්ෂිතයක් ලෙස උකස් තැබීමට ද නොහැකිය. ඇතුළත් කිරීම්වල නිවැරදි භාවය තහවුරු කරගැනීම සඳහා සෑම ගනුදෙනුවකට පසුව ම එය පරීක්ෂා කර බැලිය යුතු ය. යම් වරදක් වෙතොත් වහාම ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

4.4 පාස්පොතෙහි ඇතුළත් කිරීමක්/කිරීම්වලින් තොරව තැන්පතු සිදු කිරීමට ද අයකිරීම්/හරකිරීම් සිදු කිරීමට ද ඉඩ ඇති බැවින් පාස්පොත මගින් අවශ්‍යයෙන් ම ගිණුමෙහි නිවැරදි ශේෂය දක්වනු නොලැබේ.

4.5 නිකුත් කරන ලද පාස්පොත නිරතුරුව යාවත්කාලීන කළ යුතු අතර, එහි සටහන් කර නොමැති ගනුදෙනු ගණන 15 ඉක්මවන විට හෝ කලින් කලට බැංකුව විසින් නියම කරනු ලබන වෙනත් ගණනක් ඉක්වන විට, බැංකුව විසින් එහි අභිමතය පරිදි එම ගනුදෙනු පිළිබඳ පත්‍රිකාවක් ගිණුම් හිමියා/හිමියන්ගේ අවසානයට දන්නා ලිපිනය වෙත තැපල් මගින් එවනු ඇත.

4.6 දෛනිකව පවතින ශේෂය මත පොලිය ගණනය කරනු ඇති අතර, මාසය අවසානයට පෙර අදාළ ගිණුමට හෝ ගිණුම් හිමියා/හිමියන් විසින් නම් කරන ලද වෙනත් ගිණුමකට පවතින අනුපාතය මත මාසිකව බැර කරනු ඇත.

## 5. **පාස්පොත් ඉතුරුම් වෙතින් මුදල් ආපසුගැනීම**

5.1 ධනාත්මක හඳුනාගැනීමක් මත සහ විශේෂයෙන්ම, පාස්පොත ඉදිරිපත් කිරීම මත මුදල් ආපසු ගැනීමට අවසර ලැබෙනු ඇත. අදාළ අවස්ථාවන් හි දී මුද්දර ගාස්තු, හර බදු, හෝ ශ්‍රී ලංකා රජය විසින් පනවනු ලබන වෙනත් යම් ව්‍යවස්ථාපිත අයකිරීම්/බදු/ගාස්තු ගිණුම් හිමියා/ හිමියන් විසින් ගෙවිය යුතු වේ.

**ඉතුරුම් ගිණුම් සඳහා පමණයි**

## 6. ගිණුම් විවෘත කිරීම

6.1 තනි ඉතුරුම් ගිණුමක් විවෘත කිරීම සඳහා වන අවම මුල් තැන්පතු මුදල වන්නේ රු.100,000/- ක් (ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ එකක් පමණි) හෝ වෙනත් ඕනෑම නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වටිනාකමකින් යුතු විය අතර, ගිණුම් හිමියා/ගිණුම් හිමියන් විසින් බහුවිධ ගිණුම් පවත්වාගෙන යන්නේ නම්, ගිණුම් කළඹෙහි පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ ශේෂයන් රු.100,000/- විය යුතු වේ. කෙසේ වුවද, කලින් කලට අවම ශේෂය ප්‍රතිශෝධනය කිරීමට බැංකුවට අයිතිය පවතින අතර, ගිණුම් හිමියා වෙත පූර්ව දැනුම්දීමක් සහිතව, මූලික තැන්පතු මුදල වෙනස් කෙරෙනු ඇත.

මෙහි සඳහන් ඉතුරුම් ගිණුම් යනුවෙන් හැඳින්වෙන්නේ බැංකුවෙහි ස්මාට් ඉතුරුම් ගිණුම්, ඊ සේවර් හා ට්‍රිප්ල් සේවර් ගිණුම් ඇතුළු සියලුම ඉතුරුම් ගිණුම් සහ පවත්නා සහ/හෝ ස්ථිර තැන්පතු හැරෙන්නට, බැංකුව විසින් අනාගතයේ දී හඳුන්වා දෙනු ඇති වෙනත් ඕනෑම ඉතුරුම් ගිණුමක් වේ.

## 7. පොලිය

7.1 ඉතුරුම්/තැන්පතු ගිණුම් සඳහා ගෙවිය යුතු කිසියම් පොලී අනුපාතිකයක්, බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් ගිණුම් හිමියා / හිමියන් වෙත ලබාදුන් පූර්ව-දැනුම්දීමක් ලෙස සැලකෙනු ඇත.

7.2 ඉතුරුම් ගිණුම් වන ගිණුම/ගිණුම් සඳහා දෛනිකව පවතින ශේෂය මත පොලිය ගණනය කරනු ඇති අතර, මාසය අවසානයට පෙර අදාළ ගිණුමට හෝ ගිණුම් හිමියා/හිමියන් විසින් නම් කරන ලද වෙනත් ගිණුමකට හෝ පවතින අනුපාතය මත මාසිකව බැර කරනු ඇත. රුපියල් ජංගම ගිණුම් වල පවතින බැර ශේෂයන් සඳහා බැංකුව විසින් කිසිදු පොලී මුදලක් ගෙවනු නොලැබේ.

7.3 ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති පරිදි, සියලුම ගිණුම් හිමියා/හිමියන් විසින් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයෙහි ඇති සිය බදු තත්ත්වය සහ නේවාසික තත්ත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ප්‍රකාශනය සම්පූර්ණ කළ යුතුය. කලින් කලට අදාළ වන පරිදි, පොලී ගෙවීම් මත රඳවාගැනීමේ බද්ද ගිණුම් හිමියා/හිමියන් විසින්



PUBLIC

ඉදිරිපත් කර ඇති ප්‍රකාශනයට අනුකූල වන පරිදි අදාළ කාලසීමාව සඳහා බැංකුව විසින් ගෙවිය යුතු පොලියෙන් අඩු කරනු ඇත.

**ජංගම ගිණුම් සඳහා පමණයි**

8. ගිණුම් විවෘත කිරීම

8.1 බැංකුව විසින් පිළිගත් සේවායෝජකයෙකු වෙතින් හෝ බැංකුවට පිළිගත හැකි වෙනත් ජංගම ගිණුම් හිමියෙකු වෙතින් හෝ ලබාගත් නිර්දේශ කිරීමේ ලිපියක් හෝ යම් වාණිජ බැංකුවක අදාළ ගනුදෙනුකරු/ගිණුම් හිමියා/හිමියන් විසින් ජංගම ගිණුමක් පවත්වාගෙන යන වෙනත් වාණිජ බැංකුවකින් ලබාගත් ලිපියක් හෝ ඉදිරිපත් කිරීමෙන්, පුද්ගලයන්ට රුපියල් ජංගම ගිණුමක් විවෘත කිරීමට හැක.

8.2 තනි පුද්ගලික ජංගම ගිණුමක් විවෘත කිරීම සඳහා වන අවම මුල් තැන්පතු මුදල වන්නේ රු.100,000/-ක් (ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ එකක් පමණි) හෝ වෙනත් ඕනෑම නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වටිනාකමකින් යුතු විය අතර, ගිණුම් හිමියා/ගිණුම් හිමියන් විසින් බහුවිධ ගිණුම් පවත්වාගෙන යන්නේ නම්, ගිණුම් කළඹෙහි පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ ශේෂයන් රු.100,000/- විය යුතු වේ. කෙසේ වුවද, කලින් කලට අවම ශේෂය ප්‍රතිශෝධනය කිරීමට බැංකුවට අයිතිය පවතින අතර, ගිණුම් හිමියා වෙත පූර්ව දැනුම්දීමක් සහිතව, මූලික තැන්පතු මුදල වෙනස් කෙරෙනු ඇත.

9. **චෙක්පොත්**

9.1 ඉල්ලීමක් මත, රුපියල් ජංගම ගිණුම් හිමියා/හිමියන් වෙත චුම්භක තීන්ත අකුරු හඳුනාගැනීම සහිත මුද්‍රණය කළ චෙක්පොතක්/පොත් සපයනු ඇත. රජයේ මුද්දර ගාස්තු පවතී නම්, ඒවා සහ මුද්‍රණ පිරිවැය ආවරණය කරගැනීම සඳහා මෙම චෙක්පොත් සැපයීම සඳහා අදාළ ගාස්තු අය කෙරෙනු ඇත. මෙකී ගාස්තු, බැංකුවේ ගාස්තු අයකුම ලේඛනයෙන් ලබාගත හැකිය.

9.2 චෙක්පොත් සඳහා වන අයදුම් කිරීමේ සියලු ඉල්ලීම් ලැබීමෙන් පසු බැංකුවේ වාර්තාගත වී ඇති ලිපිනයට තැපැලෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත අවශ්‍ය චෙක්පොත යවනු ඇත. කිසියම් යැවීමේ ආකාරයක් මගින් ඇතිවන යම් ප්‍රමාදයක් හෝ හානියක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

9.3 නව චෙක්පොතක් ලැබීමෙන් පසුව, ගිණුම් හිමියා/හිමියන් විසින් එය භාවිත කිරීමට පෙර චෙක්පත් අනුක්‍රමික අංකයන්, ගිණුම් අංකය හා ගිණුම් හිමියා/හිමියන්ගේ නම ඒ මත මුද්‍රණය කර ඇත්දැයි යන්න හා චෙක්පත් ගණන තහවුරු කරගත යුතුය. කිසියම් අක්‍රමිකතාවක් වේ නම්, වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

9.4 යම් චෙක්පතක් ලිවීමට පෙර, ගිණුම් හිමියා/හිමියන් විසින් චෙක්පොතෙහි ඉදිරි කවරයේ ඇතුළත මුද්‍රණය කර ඇති නිකුත් කිරීමේ කොන්දේසි කියැවිය යුතුය. එම කොන්දේසි මගින් සහ කලින් කලට නිකුත් කරනු ලබන කොන්දේසි සංශෝධනය කිරීම් මගින් ගිණුම් හිමියා/හිමියන් බැඳී සිටිනු ඇත.

9.5 බැංකුව වෙත ලබාදෙන ලද මැන්ඩේට පත්‍රය හා ආදර්ශ අත්සන් වලට අනුව ගිණුම් හිමියා/හිමියන් විසින් චෙක්පත් අත්සන් කළ යුතුය. අත්සන් වල හෝ අත්සන්කරුවන්ගේ සිදුවන යම් වෙනසක් සම්බන්ධයෙන් වහාම බැංකුව වෙත ලිඛිතව දැන්විය යුතුය.

9.6 චෙක්පත් ස්ථිර තීන්ත වලින් පැහැදිලිව ලිවිය යුතු වන අතර, බැංකුව විසින් සපයා ඇති චෙක්පත් මත පමණක් ලිවිය යුතුය. යම් වෙනස් කිරීමක් ලියන්නාගේ සම්පූර්ණ අත්සන/අත්සන් සහිතව තහවුරු කළ යුතුය. චෙක්පත් ලිවීම සඳහා ඉලෙක්ට්‍රික් / ඉලෙක්ට්‍රොනික යතුරුලියනයන් සහ මකා දැමිය හැකි තීන්ත යොදා නොගත යුතුය. වහාම සොයාගැනීමට නොහැකි වෙනස් කිරීමක් මගින් පැන නගින පාඩු සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නොසිටින බව ගිණුම් හිමියා/හිමියන් පිළිගනියි.

9.7 චෙක්පත් නැතිවී/සොරාගෙන හෝ අස්ථානගත වුවහොත්, චෙක්පත් අංකය, දිනය, මුදල හා ගෙවනු ලබන්නාගේ නම දක්වමින් ගෙවීම් නතර කිරීමට ගිණුම් හිමියා/හිමියන් විසින් වහාම ලිඛිතව බැංකුව වෙත දැනුම් දිය යුතුය. එවැනි උපදෙසක් ලැබෙන වේලාව තෙක් අදාළ චෙක්පත/චෙක්පත් සඳහා ගෙවා නැති නම් පමණක් එම සියලු උපදෙස් ක්‍රියාත්මක වනු ඇත. දුරකථනය මගින් ගෙවීම් නතර කරන ලෙස ලබාදෙන උපදෙස් පැය 48ක් තුළ ලිඛිතව තහවුරු කළ යුතුය. පැය 48ක් තුළ එම ලිඛිත උපදෙස් නොලැබෙන්නේ නම්, ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දීමකින් තොරව ගෙවීම් නතර කිරීමේ උපදෙස් අවලංගු කිරීමට බැංකුවට අයිතිය පවතී. පැය 48ක් තුළ ලිඛිතව තහවුරු නොකළ ගෙවීම් නතර කිරීමේ උපදෙස් මත ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳී නැත. මෙම කරුණ සඳහා හානිපූරණ ආකෘති පත්‍රයක් නිසි ලෙස සම්පූර්ණ කළ යුතු වේ.



PUBLIC

9.8 භාවිත නොකරන විට චෙක්පොත් ආරක්ෂිත ස්ථානයක තබා තිබෙන බවට ගිණුම් හිමියා/හිමියන් විසින් සහතික විය යුතුය.

9.9 චෙක්පොතක් භාවිත කිරීමෙන් මෙහෙයවීමට අවසර නොමැති ගිණුම් කාණ්ඩයක ගිණුමක් විවෘත කිරීමේ දී ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුව විසින් චෙක්පොත් නිකුත් කරනු නොලැබේ.

9.10 ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි වලට අනුකූලවීම සම්බන්ධයෙන් ඕනෑම චෙක්පතක් අවහිර කිරීමේ සහ/හෝ අගරු කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

## 10. මුදල් ආපසු ගැනීම්

10.1 බැංකුව සමග ඇති කරගන්නා විශේෂ පූර්ව පිළියෙළ කිරීමකින් හැර ගිණුම් හිමියා/හිමියන් විසින් සිය ගිණුම් අයිරා නොකළ යුතුය. ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති නම්, චෙක්පත් අගරු කිරීමට බැංකුවට අයිතිය ඇත. අගරු වන සෑම චෙක්පතක් සඳහා ම ගාස්තු අය කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි. බැංකුව විසින් එහි තනි අභිමතය පරිදි ගිණුම අයිරා කරමින් චෙක්පතක් සඳහා ගෙවීම කළ හැකිය. එවැනි අවස්ථාවක දී ඉල්ලූ විටෙක කොන්දේසි විරහිතව, පොලිය හා බැංකු ගාස්තු ඇතුළුව අයිරා වූ මුදල ආපසු ගෙවීමට ගිණුම් හිමියා/හිමියන් බැඳී සිටියි. ගිණුම් හිමියා/හිමියන් වෙතින් පොලී සහ බැංකු ගාස්තු අය කරගැනීමේ අයිතිය බැංකුව සතු වේ. බැංකුව විසින් කිසියම් අයිරා පහසුකමක් ලබාදීමට බැඳී ඇති ලෙසට ප්‍රකාශිත හෝ ව්‍යංග ආකාරයේ එකඟතාවක් ලෙස මෙය අර්ථනිරූපනය නොකළ යුතුය.

10.2 කලින් කලට නීති මගින් නියම කරන ගනුදෙනු මත ද ඇතුළුව රජයේ පවතින සියලු අය කිරීම් හා බදු ගිණුම් හිමියා/හිමියන් වෙතින් අය කෙරෙනු ඇත. නීතියෙහි ප්‍රතිපාදන වලට අනුකූලව ක්‍රියා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම් හිමියා/හිමියන්ට දරන්නට සිදුවන අයැදීම් හා පාඩු සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

## 11. නියාමන ගිණුම් සඳහා

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග සහ/හෝ නියාමනයන්ට විෂය වන සහ එමගින් පාලනය වන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් නියාමන ගිණුම් (PFCA), ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA),

ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCA), ආමුඛ ආයෝජන ගිණුම් (IIA), රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCA), රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRA), විශේෂ තැන්පතු ගිණුම් (SDA), ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIA), අනේවාසික රුපියල් ගිණුම් (NRRA), සංක්‍රමණික ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් (ERIA) ආදී නියාමන ගිණුම් ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, එමගින් සිදුකරනු ලබන සියලු ඔන්ලයින් බැංකුකරණ ගනුදෙනු, HSBC පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ වේදිකාව (PIB) මගින් සිදු කිරීම සීමාකොට ඇත.

ඉහත සඳහන් නියාමන ගිණුම් වෙතින් සිදු කරනු ලබන පුද්ගලික අන්තර්ජාල බැංකුකරණ (PIB) ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීම් මගින් පැන නැගෙන කිසිදු ආකාරයක පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනියි.

**කාල තැන්පතු සඳහා පමණයි**

12. **ගිණුම් විවෘත කිරීම**

12.1 රුපියල් ලක්ෂය (රු.100,000/-) ක අවම තැන්පතුවක් මගින් රුපියල් කාල තැන්පතු ගිණුමක් විවෘත කළ හැකි අතර, විදේශ ව්‍යවහාර මුදල් කාල තැන්පතු වන කාල තැන්පතු ගිණුමක් අදාළ විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂය (රු.100,000/-)ක ට සමාන මුදලකින් එක් (01) මාසයක අවම කාලසීමාවක් සඳහා විය යුතුය. රුපියල් කාල තැන්පතු ගිණුමක් සඳහා අවශ්‍ය වන මූලික තැන්පතු මුදල බැංකුව විසින් ගිණුම් හිමියා වෙත පූර්ව දැනුම්දීමක් සහිතව කලින් කලට වෙනස් කළ හැකිය. කෙසේ වුවද, බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් ගිණුම් හිමියා / හිමියන් වෙත දැනුම් දීමක් සහිතව අවම ශේෂය කලින් කලට සමාලෝචනය කිරීමට බැංකුවට අයිතිය පවතී.

13. **මුදල් ආපසු ගැනීම**

13.1 කාල තැන්පතුවල මුදල් ආපසු ලබාගත හැක්කේ, කල් පිරීමේ දී පමණි. මුදල් ප්‍රතිආයෝජනයට උපදෙස් ලබා දී නොමැතිවීමට යටත් ව, යම් කාල තැන්පතුවක කල් පිරීමේ මුදල් ලබාගත හැකි වනුයේ කල් පිරීමේ දිනයට පසුව වහාම එළඹෙන බැංකු වැඩකරන දිනයේ දී පමණකි.

13.2 කෙසේ වුවද, ගිණුම් හිමියා/හිමියන් විසින් ඉදිරිපත් කරනු ලබන නිසි අවසරය (බැංකුවට ලබා දී ඇති මැන්ඩේට් පත්‍රයට අනුව) සහිත ලිඛිත ඉල්ලීම් මත, බැංකුව විසින් සිය අභිමතය යටතේ,

කල් පිරීමට පෙර කාල තැන්පතු නිදහස් කිරීම සිදු කළ හැක. බැංකුවේ අභිමතය මත කල් පිරීමට පෙර නිදහස් කරන ලද කාල තැන්පතු, ගාස්තු ලේඛන අයක්‍රමයේ දක්වා ඇති පරිදි දඬුවම් ගාස්තු වලට විෂය වේ.

13.3 වැඩිදුර තැන්පතු සමග එකතු කිරීම සඳහා, කල් පිරීමට පෙර ආපසු ගැනීම් ද ඇතුළුව කිසියම් හේතුවක් මත කාල තැන්පතු ආපසු ගැනීමක් සහ, කල් පිරීමට පෙර, පවතින තැන්පතු ප්‍රමාණය ආපසු ලබාගෙන, නැවත තැන්පත් කිරීම ද දඬුවම් ගාස්තු වලට යටත් වනු ඇත. බැංකුවේ අභිමතය පරිදි දඬුවම් ගාස්තුව තීරණය කෙරෙනු ඇති අතර, මුල් තැන්පතු මුදලින් අඩුවීමක් ඇති වන පරිදි එය මුල් තැන්පතු මුදලින් අඩු කරගත හැකිය.

13.4 පටහැනි ආකාරයට විශේෂිත උපදෙස් ලබා දී නොමැති අවස්ථාවක, කල් පිරීමේ දී, එම කල් පිරෙන දින පවතින පොලී අනුපාතිකය මත, සමාන කාලසීමාවක් සඳහා කාල තැන්පතු නැවත අලුත් කෙරෙනු ඇත.

13.5 කාල තැන්පතු මත මුදල් ආපසු ගැනීම් හා පොලී ගෙවීම් සම්බන්ධයෙන් නියාමකයින් විසින් සීමා කිරීම් පනවනු ලබන අවස්ථාවක දී, ගිණුම් හිමියා/හිමියන් එවැනි සීමා කිරීම්වලින් බැඳී සිටිනු ඇත.

## 14. **පොලිය**

14.1 පවතින කාල තැන්පතු වල එකඟ වූ පොලී අනුපාතය කල්පිරෙන තෙක් වෙනස් නොකිරීම හැර, කාල තැන්පතු වල පොලී අනුපාතය පූර්ව දැනුම්දීමකින් යුතුව වෙනස් වීමට යටත් වේ. කාල තැන්පතු/ඉතුරුම්/තැන්පතු ගිණුම් සඳහා ගෙවිය යුතු කිසියම් පොලී අනුපාතිකයක්, බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් ගිණුම් හිමියා / හිමියන් වෙත ලබාදුන් පූර්ව-දැනුම්දීමක් ලෙස සැලකෙනු ඇත.

## 15. **උපයෝගිතා බිල්පත් ගෙවීම**

15.1 ගිණුම් හිමියා විසින් අදාළ උපයෝගිතා සමාගම සමග පවත්වාගෙන යනු ලබන ගිණුම සම්බන්ධයෙන් ATM යන්ත්‍ර හෝ පුද්ගලික අන්තර්ජාල බැංකුකරණය (PIB) මගින් උපයෝගිතා බිල්පත් ගෙවා ඇති අවස්ථාවක දී, නිසි වේලාවට බැංකුව විසින් උපයෝගිතා සමාගම වෙත ගෙවීම් සිදුකර තිබීමට යටත් වේ.



PUBLIC

16. **ඇමතුම් මධ්‍යස්ථාන සේවා සහ ඇමතුම් මධ්‍යස්ථාන සේවා හානිපූරණය**

16.1 බැංකුව විසින් සපයන ඇමතුම් මධ්‍යස්ථාන සේවාවන් (බැංකුවේ පරම අභිමතය පරිදි) මගින් පහත කරුණු සම්බන්ධයෙන් වන දුරකථන උපදෙස් ආවරණය වේ;

16.1.1 ගිණුම් හිමියාගේ ගිණුම් අතර අරමුදල් පැවරීම:
හවුල් ගිණුම සම්බන්ධයෙන්, අත්සන් කිරීමේ උපදෙස් ලබා දී ඇත්තේ ඕනෑම එක් පාර්ශ්වයක් සඳහා නම් පමණක්, පැවරීම් සඳහා අවසර ලැබෙනු ඇත. එවැනි අවස්ථාවලදී පැවරීම, එම ගිණුම් හිමියා/හිමියන්ගේම තනි හෝ හවුල් ගිණුම් අතර විය යුතුය.

16.1.2 ගිණුම් ශේෂය, අවසන් ගනුදෙනු (ගිණුම් හිමියාගේ ගිණුම් සම්බන්ධව), විනිමය අනුපාත හා තැන්පතු අනුපාත පිළිබඳ විමසීම.

16.1.3 ප්‍රකාශන සඳහා (තෝරාගත් ගිණුම් සඳහා), චෙක්පොත් (දෙවන චෙක්පොත හා ඉන් අනතුරුව) හා ගිණුම් හිමියාගේ ගිණුම සම්බන්ධව චෙක්පත් ගෙවීම් නැවතීම සඳහා ඉල්ලීම්; සහ

16.1.4 බැංකුව විසින් කලින් කලට හඳුන්වා දෙන වෙනත් යම් ආකාරයක බැංකුකරණ හෝ ආයෝජන සේවාවන්.

16.2 උපකරණවල යම් අවක්‍රියාකාරීත්වයක් හෝ ඇණහිටීමක් ද ඇතුළත්ව, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුවේ පාලනයෙන් බාහිර යම් හේතුවක් නිසා යම් දුරකථන උපදෙසක් ඉටුකිරීමට අසමත් වීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් ගිණුම් හිමියා වෙත වගකිව යුතු නොවන අතර, උපදෙස් ඉටුකිරීම මගින් පැන නගින හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සෘජු, වක්‍ර හෝ ආනුෂාංගික අලාභයන් සඳහා කිසිදු තත්ත්වයක් යටතේ බැංකුව ගිණුම් හිමියා වෙත වගකීමට බැඳී නැති අතර, සියලුම අවස්ථාවල දී හානිපූරණය කිරීමට ද, සෘජුව හෝ වක්‍ර ලෙස බැංකුව දුරකථන උපදෙස් භාර ගැනීම තුළින් සහ ඒ මත ක්‍රියා කිරීමෙන් හෝ ක්‍රියා කිරීමට අසමත්වීම හා සම්බන්ධයෙන් පැන නගිනු ඇති සියලුම නඩු, නීතිමය කටයුතු, අයැදීම්, අලාභ, හානි, පිරිවැය හා වියදම් යනාදියෙන් බැංකුව ආරක්ෂා කර තැබිය යුතු ය. දුරකථන බැංකුකරණ සේවාව අවසන් කිරීම නොතකා මෙම හානිපූරණය අඛණ්ඩව පවතිනු ඇත.

16.3 මෙහි සඳහන් වන නීතිරීති හා කොන්දේසි වලට අනුව දුරකථන උපදෙස් ලබාදීමට ගිණුම් හිමියාට ඇති අයිතිය සියලුම අවස්ථාවල දී බැංකුවේ අභිමතයට යටත් වනු ඇති අතර, බැංකුව

විසින් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක දී එම අයිතිය ඉවත් කිරීමට හැකිය.

16.4 දුරකථන හෝ වෙනත් උපදෙස් ලබාදීම සඳහා ගිණුම් හිමියාගේ ගිණුමෙහි සහ/හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් (හෝ පූර්ව-පිළියෙළ කරගත් ණයවර පහසුකම්) පවතින බවට ගිණුම් හිමියා සහතික විය යුතු අතර, බැංකුවෙහි අසමත් වීමකින් පැන නගින යම් ආනුෂංගයක් සඳහා බැංකුව වගකීමට බැඳී නොමැති අතර, කෙසේ වුවද සැමවිටම බැංකුව විසින් සිය තනි අභිමතය මත එවැනි ප්‍රමාණවත් නොවීමක් නොතකා උපදෙස් ඉටුකිරීමට තීරණය කළහොත් බැංකුව විසින් පූර්ව අනුමැති ඉල්ලුම්පතක් හෝ ගිණුම් හිමියාට දැනුම්දීමක් නොකර එසේ සිදුකරනු ඇති අතර, එමගින් ඇති වන අයිරාව, අත්තිකාරම හෝ ණයවරය සම්බන්ධයෙන් සහ එම කාලයේ දී බලපැවැත්වෙන හා ඊට අදාළ ගාස්තු සඳහා ගිණුම් හිමියා වගකිවයුතු වනු ඇත.  අයිරාව, අත්තිකාරම හෝ ණයවරය බැංකුව විසින් සිය පූර්ණ අභිමතය මත තීරණය කරනු ලබන පොළී අනුපාත වලට යටත් වනු ඇති අතර, එවැනි ගිණුම් වලට අදාළ වන බැංකුවේ සාමාන්‍ය නීතිරීති සහ අනෙකුත් නීතිරීති මගින් පාලනය වනු ඇත.

16.5 ඇමතුම් මධ්‍යස්ථානය හරහා ලබාදෙන ලද සේවාවන් සම්බන්ධයෙන් බැංකුවේ ගාස්තු අයකුම ලේඛනයට අනුව සේවා ගාස්තු සහ වෙනත් ගාස්තු පැනවීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

16.6 බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය හරහා සිදුකරනු ලබන අමෙරිකානු ඩොලර් නොවන විදේශ ව්‍යවහාර මුදල් වර්ග දෙකකින් සිදුකරන ගනුදෙනු (cross currency) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විදේශ විනිමය රෙගුලාසි මගින් ගිණුම් හිමියා/හිමියන් පාලනය කෙරෙනු ඇත.

16.7 බැංකුව විසින් කලින් කලට, මෙම වගන්තියේ සඳහන් සේවා විෂයපථය, සේවා ගාස්තු සහ වෙනත් අයකිරීම් සහ මෙහි සඳහන් නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීමට, ඉවත් කිරීමට, එකතු කිරීමට සංශෝධනය කිරීමට අයිතිය රඳවා ගන්නා අතර, ඒ සම්බන්ධයෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දීම ප්‍රකාශනය සමග විස්තරයක් හෝ ඇමුණුමක් ලෙස සහ/හෝ බැංකුවේ ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් එකී සංශෝධන පිළිබඳව ගිණුම් හිමියා / හිමියන් වෙත ලබා දුන් පූර්ව-දැනුම්දීමක් ලෙස සැලකෙනු ඇති අතර, ගිණුම් හිමියා එයින් බැඳී සිටිනු ඇත.



PUBLIC

## 16.8 **හානිපූරණය**

16.8.1 අමතන්නාගේ අව්‍යාජ භාවය තහවුරු කරගැනීම සඳහා බැංකුව විසින් සියලුම සාධාරණ පියවර ගනු ඇති නමුත්, බැංකුව සද්භාවයෙන් සහ දැඩි නොසැලකිල්ල පිළිබඳ වරදකාරීත්වයකින් තොරව ක්‍රියා කිරීමට යටත්ව, දුරකථනයෙන් ලැබෙන එවැනි ඉල්ලීම් ඉටු කිරීමේ දී බැංකුව විසින් සිදුකරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් ගිණුම් හිමියා වෙත හෝ වෙනත් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයෙකින් වගකීමට බැඳී නොමැත.

16.8.2 බැංකුව හානිපූරණය කිරීමට ද සෑම අවස්ථාවක දී ම සියලුම නඩු, නීතිමය කටයුතු, අයැදීම්, අලාභ, හානි, පිරිවැය හා කිසියම් පාර්ශ්වයක් විසින් බැංකුවට එරෙහිව ගෙන එන යම් නඩුවක හෝ, බැංකුව විසින් දුරකථන උපදෙස් පිළිගනිමින් ක්‍රියා කිරීම හෝ ඒ අනුව ක්‍රියා කිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් බැංකුව විසින් සිදුකරන යම් ක්‍රියාවක්, කටයුත්තක් හෝ දෙයක් මගින් සෘජුව හෝ වක්‍ර ලෙස බැංකුවට දරන්නට සිදුවන වියදම් යනාදියෙන් බැංකුව ආරක්ෂාකර තැබීමට ද ගිණුම් හිමියා/හිමියන් එකඟ වී භාරගනියි.

16.8.3 බැංකුව සද්භාවයෙන් යුතුව සහ දැඩි නොසැලකිල්ල පිළිබඳ වරදකාරීත්වයකින් තොරව ක්‍රියා කිරීමට යටත්ව, සිදුකරන ලද යම් මුදල් පැවරීමක් හෝ ගිණුම් හිමියා/හිමියන් ට සහ/හෝ අමතන්නා වෙත බැංකුව විසින් ලබාදෙන ලද කිසියම් තොරතුරක් සම්බන්ධයෙන් හෝ එමගින් සෘජුව හෝ වක්‍රව ආනුෂංගික වශයෙන් ඕනෑම ආකාරයකින් පැන නගින යම් අලාභයක් හෝ හානියක් සඳහා බැංකුවට එරෙහිව කිසිදු ආකාරයක අයැදීමක් ගිණුම් හිමියා/හිමියන්ට නොමැති බවට ගිණුම් හිමියා/හිමියන් එකඟ වෙයි.

16.8.4 ඇමතුම් මධ්‍යස්ථාන සේවාව අවසන් කිරීමක් සිදුවුවද එය නොතකා මෙම හානිපූරණය අඛණ්ඩව පවතිනු ඇත.

## 17. **දුරකථන බැංකුකරණය**

17.1 බැංකුව විසින් සපයන දුරකථන බැංකුකරණ සේවාවන් මගින් පහත කරුණු ආවරණය වේ:

17.1.1 ගිණුම් හිමියාගේ ගිණුම් අතර අරමුදල් පැවරීම.

17.1.2 කලින් නිශ්චය කළ හා එකඟ වූ පැවරීම් සීමාවන් තුළ ගිණුම් හිමියා/හිමියන්ගේ යම් ගිණුමකින්, දුරකථන බැංකුකරණ සේවාව යටතේ අරමුදල් ලැබීමේ අරමුණ සඳහා ගිණුම් හිමියා/හිමියන් විසින් ලිඛිතව නම් කළ ගිණුමකට (“කැපවූ පැවරුම්ලාභී ගිණුමක්”) අරමුදල් පැවරීම.

17.1.3 ගිණුම් ශේෂය, අවසන් ගනුදෙනු (ගිණුම් හිමියාගේ ගිණුම සම්බන්ධව), විනිමය අනුපාත හා තැන්පතු අනුපාත පිළිබඳ විමසීම.

17.1.4 ප්‍රකාශන සඳහා (තෝරාගත් ගිණුම් සඳහා), චෙක්පොත් හා ගිණුම් හිමියාගේ ගිණුම සම්බන්ධව චෙක්පත් ගෙවීම් නැවතීම සඳහා ඉල්ලීම් සහ,

17.1.5 බැංකුව විසින් කලින් කලට හඳුන්වා දෙන වෙනත් යම් ආකාරයක බැංකුකරණ හෝ ආයෝජන සේවාවන්.

17.2 දුරකථන මගින් ගිණුම් හිමියා/හිමියන් විසින් ලබාදෙන උපදෙස් මත ක්‍රියා කිරීමට බැංකුවට අවසර ඇති නමුත්, එම උපදෙස් මත ක්‍රියා කිරීමට බැඳී නැති අතර, ගිණුම් හිමියා/හිමියන් වෙතින් ලැබෙන්නේ යැයි බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි විශ්වාස කරන යම් දුරකථන උපදෙසක් මත ක්‍රියා කිරීමට බැංකුවට අවසර ඇති බවට ගිණුම් හිමියා/හිමියන් එකඟ වන අතර, අනවසර පුද්ගලයන් වෙතින් ලැබෙන දුරකථන උපදෙස් වලට අනුකූලව සද්භාවයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට ලක් නොවන අතර, දුරකථන උපදෙස් ලබාදෙන පුද්ගලයා (පුද්ගලයන්) ගේ අනන්‍යතාව තහවුරු කරගැනීමට යුතුකමක් ද නොපවතී.

17.3 සියලුම අවස්ථාවන් හි දී පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) ඉතාම රහසිගතව තබාගැනීමට ගිණුම් හිමියා/හිමියන් භාරගෙන සිටින අතර පුද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) නැතිවීමක දී හෝ එම PIN අංකය අනවසර පාර්ශ්වයක් අතට පත්වී ඇති බවට දැනගත් විටෙක වහාම බැංකුව වෙත වාර්තා කළ යුතුය.

17.4 උපකරණවල යම් අවක්‍රියාකාරීත්වයක් හෝ ඇණහිටීමක් ද ඇතුළත්ව, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුවේ පාලනයෙන් බාහිර යම් හේතුවක් නිසා යම් දුරකථන උපදෙසක් ඉටුකිරීමට අසමත් වීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් ගිණුම් හිමියා වෙත වගකිව යුතු නොවන අතර, උපදෙස් ඉටු කිරීම මගින් පැන නගින හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සෘජු, වක්‍ර හෝ ආනුෂාංගික අලාභයන් සඳහා කිසිදු තත්ත්වයක් යටතේ බැංකුව ගිණුම් හිමියා වෙත වගකීමට බැඳී නැති අතර, සියලුම අවස්ථාවල දී හානිපූරණය කිරීමට ද, සෘජුව හෝ වක්‍ර ලෙස බැංකුව දුරකථන උපදෙස් භාරගැනීම තුළින් සහ ඒ මත ක්‍රියා කිරීමෙන් හෝ ක්‍රියා කිරීමට



PUBLIC

අසමත්වීම හා සම්බන්ධයෙන් පැන නගිනු ඇති සියලුම නඩු, නීතිමය කටයුතු, අයැදීම්, අලාභ, හානි, පිරිවැය හා වියදම් යනාදියෙන් ගිණුම් හිමියා/හිමියන් විසින් බැංකුව ආරක්ෂා කර තබනු ඇත. දුරකථන බැංකුකරණ සේවාව අවසන් කිරීම නොතකා මෙම හානිපූරණය අඛණ්ඩව පවතිනු ඇත.

17.5 මෙහි සඳහන් වන නීතිරීති හා කොන්දේසි වලට අනුව දුරකථන උපදෙස් ලබාදීමට ගිණුම් හිමියාට ඇති අයිතිය සියලුම අවස්ථාවල දී බැංකුවේ අභිමතයට යටත් වනු ඇති අතර, බැංකුව විසින් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක දී එම අයිතිය ඉවත් කිරීමට හැකිය.

17.6 දුරකථන හෝ වෙනත් උපදෙස් ලබාදීම සඳහා ගිණුම් හිමියාගේ ගිණුමෙහි සහ/හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් (හෝ පූර්ව වශයෙන් පිළියෙළ කරගත් ණයවර පහසුකම්) පවතින බවට ගිණුම් හිමියා සහතික විය යුතු අතර, බැංකුවෙහි අසමත් වීමකින් පැන නගින යම් ආනුෂංගයක් සඳහා බැංකුව වගකීමට බැඳී නොමැති අතර, කෙසේ වුවද සැමවිටම බැංකුව විසින් සිය තනි අභිමතය මත එවැනි ප්‍රමාණවත් නොවීමක් නොතකා උපදෙස් ඉටුකිරීමට තීරණය කළහොත් බැංකුව විසින් පූර්ව අනුමැති ඉල්ලුම්පතක් හෝ ගිණුම් හිමියාට දැනුම්දීමක් නොකර එසේ සිදුකරනු ඇති අතර, එමගින් ඇතිවන අයිරාව, අත්තිකාරම හෝ ණයවරය සම්බන්ධයෙන් සහ ඊට අදාළ ගාස්තු සඳහා ගිණුම් හිමියා වගකිවයුතු වනු ඇත. අයිරාව, අත්තිකාරම හෝ ණයවරය පවත්නා අදාළ පොලී අනුපාත වලට යටත් වනු ඇති අතර, එවැනි ගිණුම් වලට අදාළ වන බැංකුවේ සාමාන්‍ය නීතිරීති සහ වෙනත් නීතිරීති මගින් පාලනය වනු ඇත.

17.7 ගිණුම් හිමියා / හිමියන් විසින් ලබාදෙන ලද දුරකථන උපදෙස් මත බැංකුව විසින් සිදු කරන ලද අදාළ ගනුදෙනුවල විස්තර (ගිණුම් හිමියන් විසින් කලින් නියම කරන ලද) කැප වූ පැවරුම්ලාභී ගිණුම් හිමියන් වෙත ගිණුම් හිමියා/හිමියන් විසින් දන්වනු ඇත. එවැනි යම් දැනුම්දීමක් ලබාදීම සම්බන්ධව ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුව වගකීමකට ලක් නොවේ.

17.8 ඇමතුම් මධ්‍යස්ථානය හරහා ලබාදෙන ලද සේවාවන් සම්බන්ධයෙන් බැංකුවේ ගාස්තු අයකුම ලේඛනයට අනුව සේවා ගාස්තු සහ වෙනත් ගාස්තු පැනවීමට බැංකුව විසින් අයිතිය රඳවා ගනියි.

17.9 බැංකුව විසින් කලින් කලට, මෙම වගන්තියේ සඳහන් සේවා විෂයපථය, සේවා ගාස්තු සහ වෙනත් අයකිරීම් සහ මෙහි සඳහන් නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීමට, ඉවත් කිරීමට,

එකතු කිරීමට, සංශෝධනය කිරීමට අයිතිය රඳවා ගන්නා අතර, ඒ සම්බන්ධයෙන් ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම් දීම ප්‍රකාශනය සමග විස්තරයක් හෝ ඇමුණුමක් ලෙස සහ/හෝ බැංකුවේ ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් එකී සංශෝධන පිළිබඳව ගිණුම් හිමියා / හිමියන් වෙත ලබා දුන් පූර්ව-දැනුම්දීමක් ලෙස සැලකෙනු ඇති අතර, එම සංශෝධන බලාත්මක වන දිනය ලෙස එවැනි දැනුම් දීමකට පසු වැඩකරන දින 5ක ට නොඅඩු වන ව්‍යාපාරික දිනයක් නියමකර දක්වනු ඇත. එම කාලසීමාව ඉකුත් වීමට පෙර ගිණුම් හිමියා/හිමියන් සේවාව අවසන් නොකරන්නේ නම්, එම සංශෝධන වලට එකඟ වී ඇති බවට සැලකෙනු ඇත.

17.10 දුරකථන බැංකුකරණ සේවාවන්ට ප්‍රවේශ වීම සඳහා හෝ බැංකුව විසින් නිකුත් කළ ගිණුම් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් අංකය භාවිත කිරීම හෝ මෙම සේවාවට ප්‍රවේශ වීම සඳහා බැංකුව විසින් සපයා ඇති දුරකථන බැංකුකරණ පෞද්ගලික හඳුනාගැනීමේ අංකය (PBN) සහ පෞද්ගලික බැංකුකරණ අංකය භාවිත කිරීම, ගිණුම් හිමියා/හිමියන් විසින් මෙම නීතිරීති පිළිගැනීමක් ලෙස අර්ථනිරූපනය කෙරෙනු ඇත.

17.11 බැංකුවෙහි දුරකථන බැංකුකරණ සේවා හරහා අමෙරිකානු ඩොලර් හැර වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ග දෙකකින් (cross currency) ගනුදෙනු සිදුකරන අවස්ථාවන් හි දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පවත්නා විනිමය පාලන රෙගුලාසි මගින් ගිණුම් හිමියා/හිමියන් පාලනය වනු ඇත.

18. **බදු**

18.1 සියලුම ගිණුම් හිමියා/හිමියන් විසින් සිය බදු තත්ත්වය සහ නේවාසික තත්ත්වය සම්බන්ධයෙන් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයෙහි ඇති අදාළ ප්‍රකාශනය සම්පූර්ණ කළ යුතුය. ගිණුම් හිමියා /හිමියන් විසින් ලබා දුන් අදාළ ප්‍රකාශනය පවතින හා එම මැන්ඩේට පත්‍රය මත ම පාලනය වන විවෘත කරන නව ගිණුම් වලට අදාළ වනු ඇත. කලින් කලට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ඕනෑම අදාළ අධිකාරියක් විසින් නියම කර ඇති පරිදි පොලී ගෙවීම් මත ගෙවිය යුතු වන රඳවා ගැනීමේ බද්ද හෝ වෙනත් අදාළ බදු අදාළ කාලසීමාව සඳහා (අදාළ අනුපාතය හෝ අනුපාත යටතේ) ගෙවිය යුතු වන පොලී ගෙවීමෙන් බැංකුව විසින් අඩුකරනු ඇත. පසු අවස්ථාවක දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ඕනෑම අදාළ අධිකාරියක් විසින් බැංකුවෙන් ඉල්ලා සිටියහොත් ගිණුම් හිමියා/හිමියන්ට දැනුම් දීමකින් තොරව නොගෙවූ රඳවාගැනීමේ බදු ගිණුම් හිමියා/හිමියන්ගෙන් අයකරගැනීමට බැංකුවට අයිතිය පවතී.

19. **ගාස්තු අයකුම ලේඛනය**

බැංකුවේ අයකුම ගාස්තු ලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති සහ ලබා දී ඇති ගිණුම් සහ සේවාවන් සම්බන්ධයෙන් සේවා ගාස්තු සහ අය කිරීම් පැනවීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙතින් ඉල්ලීමක් කිරීමෙන් පසුව ගිණුම් හිමියා /හිමියන්ට ලබාගැනීමට හැකි ය. බැංකුවේ ගාස්තු අයකුම ලේඛනය බැංකුව විසින් ශ්‍රී ලංකාවේ එහි ශාඛාවන් හි ප්‍රදර්ශනය කිරීමෙන් සහ/හෝ බැංකුවේ නිල වෙබ්අඩවිය වන www.hsbc.lk හි දැක්වීමෙන් හෝ ගිණුම් හිමියා / හිමියන් වෙත දැනුම් දෙනු ඇති අතර, ගිණුම් හිමියා/හිමියන් එයින් බැඳී සිටිනු ඇත.

20. **ගිණුම් වසා දැමීම**

20.1 කිසිදු හේතුවක් නොදක්වා, යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ගිණුම් හිමියාගේ අවසානයට වාර්තාගත වී ඇති ලිපිනයට වැඩකරන දින විස්ස (20)ක ලිඛිත දැනුම් දීමකින් පසුව ගිණුමක් වසා දැමීමට බැංකුව අයිතිය රඳවා ගනියි. අනපේක්ෂිත තත්ත්වයන් යටතේ දී වෙනත් ආකාරයේ සන්නිවේදන ක්‍රම වෙත යොමුවීම/දැනුම් දීම් ලබාදීම ද බැංකුව විසින් කළ හැකි වේ.

මාස එක (01)ක අඛණ්ඩ කාලසීමාවක් ගිණුමේ ශේෂය ශුන්‍ය (0) වන විටෙක දී ගිණුම වසා දැමීමේ අයිතිය ද බැංකුව විසින් රඳවා ගනියි. ගිණුමෙහි ශේෂය ශුන්‍ය (0) වනවිට ප්‍රකාශනය හරහා ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුව විසින් ඒ බව දැනුම් දෙනු ඇත.

20.2 අදාළ කාලයෙහි බලපවත්වන විනිමය පාලන රෙගුලාසි කඩකිරීමක් සිදුව ඇති බවට බැංකුව සෑහීමකට පත්විය හැකි වුවහොත් බැංකුව විසින් සිය කැමැත්ත පරිදි ගිණුම් හිමියා/ හිමියන්ට දැනුම් දීමකින් තොරව ගිණුම වසා දමනු ඇත.

21. **තොරතුරු හෙළිදරව් කිරීම**

21.1 ගිණුම් හිමියාගේ/හිමියන්ගේ ගිණුම් සහ/හෝ ගිණුම් හිමියා/හිමියන් වෙනුවෙන් බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ගනුදෙනු පිළිබඳව තොරතුරු, ගිණුම් හිමියා/හිමියන් වෙනුවෙන් බැංකුව විසින් ගනුදෙනු සිදුකරන යම් නිසි බලප්‍රදේශයක යම් නීතියක්, රීතියක් හෝ රෙගුලාසියක් මගින් හෝ, යම් බලප්‍රදේශයක යම් විනිමය, රාජ්‍ය හෝ නියාමන අධිකාරියක් විසින් බැංකුව

වෙතින් ඉල්ලා සිටින තැනැත්තන් වෙත හෙළිදරව් කිරීම සහ යැවීම සඳහා ගිණුම් හිමියා/හිමියන් බැංකුවට අවසර ලබා දෙයි.

21.2 වර්ෂ 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත (සංශෝධිත) මගින් ගැසට් නිවේදනයක් මගින් දක්වා ඇති සීමාවට ඉහළ සියලුම තැන්පත් කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයට කලින් කලට වාර්තා කිරීමට බැංකුව බැඳී සිටියි.

21.3 HSBC සමූහය හෝ බැංකුවට අදාළ වන නීතිරීති වලට අනුව ක්‍රියා කිරීම සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බාධක වලට ලක්වනු ඇති වෙනත් තැනැත්තන් හෝ ආයතන වෙත මූල්‍ය හා වෙනත් සේවාවන් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් පවතින HSBC සමූහයේ රෙගුලාසි වලට අනුකූලව බැංකුව සහ HSBC සමූහයේ අනෙකුත් සාමාජිකයින් ක්‍රියා කළ යුතු වේ. එබැවින්, බැංකුවේ තනි සහ පූර්ණ අභිමතය පරිදි එවැනි නීතිරීති හා HSBC සමූහයේ රෙගුලාසි වලට අනුකූලව ක්‍රියා කිරීම සුදුසු යැයි සැලකීමට බැංකුවට හිමිකම පවතී.

යම් ගෙවීම් පණිවුඩයක් සහ ගිණුම් හිමියා/හිමියන් විසින් හෝ වෙතට හෝ ඔහු වෙනුවෙන් බැංකුවේ පද්ධති හරහා හෝ HSBC සමූහයේ වෙනත් සාමාජිකයෙකුගේ පද්ධතියක් එවනු ලබන වෙනත් තොරතුරක් හෝ සන්නිවේදනයක් හසුකරගැනීම හා පරීක්ෂණ කිරීම ද, යම් නමක් තහනම් පුද්ගලයෙකුගේ හෝ ආයතනයකදැයි යන්න හෝ එයින් අදාළ පුද්ගලයා හෝ ආයතනය සත්‍ය වශයෙන් ම අදහස් වන්නේ දැයි වැඩිදුර විමසීම් සිදුකිරීම ද එවැනි ක්‍රියාවන්ට ඇතුළත් වනු ඇති නමුත් ඊට සීමා නොවේ.

බැංකුව හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු යම් පාර්ශ්වයකට දරන්නට සිදුවන පහත කරුණු මගින් පැන නගින අලාභ (ඍජු හෝ ආනුෂංගික වශයෙන්, ලාභ හෝ පොලී අහිමිවීම් ද ඇතුළත් ව ඊට සීමා නොවී) හෝ හානි සම්බන්ධයෙන් වගකීමට ලක් නොවනු ඇත.

21.3.1 යම් පියවරක් මගින් මෙකී නීතිරීති හා කොන්දේසි යටතේ හෝ වෙනත් වගකීම් යටතේ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බැංකුව විසින් සිය තනි සහ පූර්ණ අභිමතය මත ක්‍රියා කිරීමට සුදුසු යැයි සලකන නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව සිය කාර්යයන් කිසිවක් ඉටු කිරීමේ දී බැංකුව හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුගේ ප්‍රමාදයක් හෝ අසමත් වීමක්; හෝ,

21.3.2 මෙම වගන්තිය යටතේ බැංකුවට පවතින යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමක්.



PUBLIC

සමහර අවස්ථාවන් හි දී බැංකුව විසින් ගන්නා ක්‍රියාමාර්ගය සමහර තොරතුරු සැකසීමේ දී ප්‍රමාදයක් වැළකීම හෝ ඇතිවීම සිදුවිය හැකිය. එබැවින් මෙම වගන්තියට අනුකූලව කරන ලද යම් ක්‍රියාවක විෂයය වන ගෙවීම් පණිවුඩ හා සන්නිවේදන වලට අදාළ ව බැංකුවේ පද්ධතිවල පවතින යම් තොරතුරක් එම ක්‍රියාව සිදු කරමින් පවතින අතරතුර එයට ප්‍රවේශ වන අවස්ථාවේදී නිවරද්‍ය හෝ යාවත්කාලීන බවට බැංකුව හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු හෝ තහවුරු නොකරයි. අදාළ යම් නීතිරීතිවල සහ HSBC සමූහයේ රෙගුලාසිවල පවතින අභිබවනය කිරීමේ අවශ්‍යතා වලට යටත්ව, ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින් එම තත්ත්වයන්ගේ පැවැත්ම සම්බන්ධයෙන් බැංකුව විසින් ගිණුම් හිමියා/හිමියන් වෙත දැනුම්දීමට උත්සාහ දරනු ඇත.

## 22. **පාරිභෝගික තොරතුරු එකතු කිරීම, සැකසුම හා හුවමාරු කරගැනීම සහ පාරිභෝගිකයාගේ බැඳීම්**

**එකතුකිරීම**

22.1 HSBC හෝ HSBC සමූහයෙහි වෙනත් සාමාජිකයන් පාරිභෝගික තොරතුරු (ගනුදෙනුකරු, ගනුදෙනුකරුගේ ගනුදෙනු, ගනුදෙනුකරු විසින් HSBC හි සැලසුම් හා සේවාවන් භාවිතය සහ HSBC සමූහය සමග ගනදෙනුකරුගේ සම්බන්ධය පිළිබඳ අදාළ තොරතුරු ද ඇතුළත්ව) එකතුකිරීම, භාවිත කිරීම හා හුවමාරු කරගැනීම සිදුකළ හැක. පාරිභෝගික තොරතුරු ගනුදෙනුකරු වෙතින් ඉල්ලා සිටිය හැකි අතර, නැතහොත් වෙනත් මූලාශ්‍රයකින් (පොදුවේ ලබාගත හැකි තොරතුරු ද ඇතුළත්ව) HSBC හෝ HSBC සමූහයේ වෙනත් සාමාජිකයෙකු වෙත ලබාගත හැකිව ඇති වෙනත් තොරතුරු සමග උත්පාදිත හෝ සම්බන්ධිතව HSBC විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයෙකු විසින් හෝ ඒ වෙනුවෙන් එකතුකර ගත හැකිය.

**සැකසුම**

22.2 HSBC සහ/හෝ HSBC සමූහයේ සාමාජිකයෙකු විසින් පහත දැක්වෙන අරමුණු සඳහා පාරිභෝගික තොරතුරු සැකසීම, පැවරීම්, හා හෙළිදරව් කිරීම සිදුකරනු ඇත. (a) ගනුදෙනුකරු විසින් ඉල්ලා සිටින ලද හෝ අවසර දෙන ලද යම් ගනුදෙනුවක් සඳහා සේවාවන් සැපයීම (b) අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීම (c) මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදුකිරීම (d) ගනුදෙනුකරු වෙතින් අයවිය යුතු යම් මුදලක් එකතුකර ගැනීම (e) ණය පරීක්ෂා සිදුකිරීම හා ණය තොරතුරු ලබාගැනීම හෝ සැපයීම (f) HSBC හෝ HSBC සමූහයෙහි සාමාජිකයෙකුගේ අයිතීන් බලාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම (g) HSBC හෝ HSBC සමූහයෙහි අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සඳහා (ණය හා අවදානම් කළමනාකරණය, පද්ධති හෝ සැලසුම් සංවර්ධනය හා නිර්මාණය කිරීම, රක්ෂණය, විගණනය හා පරිපාලන අරමුණු ද



PUBLIC

ඇතුළත්ව, ඊට සීමා නොවී) (h) පාරිභෝගිකයා සමග HSBC හි සමස්ත සම්බන්ධතාව පවත්වාගෙන යාම (මූල්‍ය සේවා හෝ ඊට අදාළ සැලසුම ගනුදෙනුකරුට අලෙවිය හෝ ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳපොල සමීක්ෂණ ද ඇතුළත්ව) ('අරමුණු').

**බෙදා-හදා ගැනීම**

22.3 HSBC විසින් (අරමුණ සඳහා අවශ්‍ය වන පරිදි හා සුදුසු පරිදි) පහත ලැබුම්කරුවන් වෙත පාරිභෝගික තොරතුරු පැවරීම හෝ හෙළිදරව් කිරීම කළ හැකි බවට සේවාවන් භාවිත කිරීම මගින් ගනුදෙනුකරුවා එකඟ වෙයි. (අරමුණු සඳහා පාරිභෝගික තොරතුරු සැකසීම, පැවරීම හා හෙළිදරව් කිරීම ඔවුන් විසින් ද සිදු කළ හැකිය):

(a) HSBC සමූහයේ ඕනෑම සාමාජිකයෙකු;

(b) HSBC සමූහයේ යම් උප-කොන්ත්‍රාත්කරුවෙකු, නියෝජිතයෙකු, සේවා සපයන්නෙකු, හෝ සම්බන්ධිත ආයතනයක් (ඔවුන්ගේ සේවකයින්, අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් ඇතුළත්ව);

(c) ගනුදෙනුකරු, ගෙවීම් ලැබුම්කරුවන්, අර්ථලාභීන්, ගිණුම් නාමිකයින්, අතරමැදි හා නියෝජිත බැංකු, නිෂ්කාශන ආයතන, නිෂ්කාශන හෝ පියවීමේ පද්ධති, වෙළඳපොළ ප්‍රතිපාර්ශ්වයන්, රඳවාගැනීමේ නියෝජිතයින්, හුවමාරු හෝ වෙළඳ මූලාශ්‍ර කොටස් හුවමාරු, කොටස් වෙළඳපොළ, ගනුදෙනුකරුට සුරැකුම්පත් (එම සුරැකුම්පත් ගනුදෙනුකරු වෙනුවෙන් HSBC විසින් දරන අවස්ථාවක දී) පිළිබඳ අයිතියක් ඇති සමාගම් වෙනුවෙන් ක්‍රියාකරන යම් කිසිවෙකු;

(d) සේවාවන් හි දී හෝ සේවාවන් සම්බන්ධයෙන් අයිතියක් ලබාගන්නා හෝ අවදානමක් භාරගන්නා යම් පාර්ශ්වයක්;

(e) ණය තොරතුරු ලබාගැනීම හා සපයාදීම සඳහා වෙනත් මූල්‍ය ආයතන, ණයවර යොමු නියෝජිත ආයතන, හෝ ණය තොරතුරු කාර්යාංශ, විගණකවරුන්/බදු උපදේශකවරුන්;

(f) ගනුදෙනුකරුට වත්කම් කළමනාකරණ සේවාවන් සපයන යම් තෙවන පාර්ශ්වයක අරමුදල් කළමනාකරුවෙකු;

(g) HSBC විසින් හඳුන්වාදීම් හෝ තොරතුරු සපයන යම් හඳුන්වාදීමේ අතරමැදියෙකු;

(h) යම් HSBC ව්‍යාපාර පැවරීම්, අතහැරීම්, ඒකාබද්ධවීම් හෝ අත්පත් කරගැනීම් හා සම්බන්ධයෙන්;

සේවාවන් සපයනු ලබන බලප්‍රදේශයන් හා සමානව යම් මට්ටමක ආරක්ෂාවක් සපයන දත්ත ආරක්ෂණ නීති නොමැති බලප්‍රදේශයන් හි පිහිටා තිබුණ ද, ඒවා ද ඇතුළත්ව.



PUBLIC

**පාරිභෝගිකයාගේ බැඳීම්**

22.4 HSBC වෙත හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙත සපයා ඇති පාරිභෝගික තොරතුරුවල යම් වෙනසක් සිදුව ඇත්නම් කලින් කලට, කවර අවස්ථාවක දී වුවද දින තිහ (30)ක් ඇතුළත වහාම HSBC වෙත ලිඛිත ව දැනුම් දීමට ද HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙතින් ලැබෙන යම් ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ද පාරිභෝගිකයා එකඟ වෙයි.

22.5 සෑම සම්බන්ධිත තැනැත්තෙකු/තැනැත්තන්, ඔවුන් විසින් HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකු වෙත තොරතුරු (පෞද්ගලික තොරතුරු හෝ බදු තොරතුරු ඇතුළත් ව) සපයා ඇති යම් තැනැත්තෙකු වෙත මෙම නීතිරීතිවල දක්වා ඇති ආකාරයට ඔවුන්ගේ තොරතුරු සැකසුම, හෙළිදරව් කිරීම හා පැවරීම සම්බන්ධව දන්වා ඇති බව හා එකඟ වී ඇති බව ගනුදෙනුකරු තහවුරු කරයි. සිය පෞද්ගලික දත්ත වලට ප්‍රවේශවීමට සහ ඒවා නිවැරදි කිරීමට එම සම්බන්ධිත තැනැත්තන් / වෙනත් යම් තැනැත්තන්ට අයිතිය ඇති බවට ගනුදෙනුකරු ඔවුන් වෙත උපදෙස් දිය යුතුය.

22.6 යම් අවස්ථාවක:

- HSBC විසින් සාධාරණව ඉල්ලා සිටින පාරිභෝගික තොරතුරු සපයා දීමට ගනුදෙනුකරු අපොහොසත් වුවහොත්;
  හෝ
- අරමුණු සඳහා තොරතුරු සැකසුම, පැවරීම හෝ හෙළිදරව් කිරීමට HSBC විසින් අවශ්‍ය කෙරෙන යම් කැමැත්ත පළකිරීමක් ගනුදෙනුකරු විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කරගතහොත්; හෝ
- මූල්‍ය අපරාධයක් සිදු කිරීමේ හැකියාව පිළිබඳව HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුට සැක පහළ වන අවස්ථාවක දී; හෝ ගනුදෙනුකරු වෙතින් HSBC සමූහයේ සාමාජිකයෙකු වෙත මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ අවදානමක් ඇතිවන අවස්ථාවක දී,

HSBC විසින්,

(a) ගනුදෙනුකරු වෙත නව සේවාවන් හෝ සේවාවන් සියල්ල හෝ ඉන් කොටසක් අඛණ්ඩව සැපයීමට නොහැකි විය හැකි අතර, ගනුදෙනුකරු සමග සිය ව්‍යාපාරික සබඳතා කිසිදු දැනුම් දීමකින් තොරව වහාම අවසන් කර දැමීමට අයිතිය රඳවා ගනියි.

(b) අනුකූලව ක්‍රියාකිරීමේ බැඳීම් ඉටුකිරීමට HSBC හෝ HSBC සමූහයේ යම් සාමාජිකයෙකුට අවශ්‍ය වන යම් පියවර ගැනීම සහ/හෝ

(c) ගනුදෙනුකාර ගිණුම (ගිණුම්) කිසිදු දැනුම් දීමකින් තොරව වහාම අවහිර කිරීම, පැවරීම හෝ වසා දැමීම කළ හැකිය.

22.7 ගනුදෙනුකරු විසින් පහත දෑ නිදේශනය කර තහවුරු කර සිටියි;

22.7.1 (i) ගනුදෙනුකරු හෝ (ii) ගනුදෙනුකරුගේ සේවකයකු හෝ නියෝජිතයකු, පහත ගණයේ පුද්ගලයකු (**"පුද්ගලයා"**) නොවන බවː

a) අමෙරිකා එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ විදේශ වත්කම් පාලන කාර්යාලය, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය, යුරෝපීය සංගමය, මහරැජිනගේ භාණ්ඩාගාරය, හොං කොං මූල්‍ය අධිකාරිය, ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අදාළ සම්බාධක අධිකාරියක් මගින් බලාත්මක කරන ලද හෝ පනවන ලද සම්බාධකයකට (පොදුවේ 'සම්බාධක') ලක්වූවකු; හෝ

b) ක්‍රිමියා කලාපය, කියුබාව, ඉරානය, උතුරු කොරියාව, සුඩානය සහ සිරියාව ද ඇතුළත්ව සම්බාධක වලට විෂය වන රජයක් පිහිටුවා ඇති රටක/කලාපයක හෝ බලප්‍රදේශයක සිටින හෝ වාසය කරන්නෙකු.

22.7.2 ගනුදෙනුකරු විසින්, සෘජු හෝ වක්‍ර ලෙස යම් ගිණුමක ඇති මුදල් හෝ බැංකුව විසින් සපයන ලද, ණයට දුන්, දායක වූ හෝ යම් අනුබද්ධ ආයතනයකට, හවුල් ව්‍යාපාරයකට හෝ වෙනත් තැනැත්තෙකු වෙත යම් ආකාරයකින් ලබා නොදෙන බවටː

a) සම්බාධක වලට ලක්ව ඇති යම් පුද්ගලයෙකු සමග හෝ එවැනි ආණ්ඩුවක් පවතින යම් රටක/කලාපයක හෝ බලප්‍රදේශයක ක්‍රියාකාරකම් හෝ ව්‍යාපාර සඳහා මුදල් ලබා නොදෙන බවට; හෝ

b) ඕනෑම තැනැත්තෙකු විසින් සම්බාධක උල්ලංඝණය කිරීමක් සිදු කෙරෙන වෙනත් කිසිදු ආකාරයකින් කටයුතු නොකරන බවට;

ගනුදෙනුකරු එකඟ වේ.

22.7.3 2010 එක්සත් රාජධානි අල්ලස් පනත (**"UK අල්ලස් පනත"**) සහ 1977 එක්සත් ජනපද විදේශ දූෂණ ක්‍රියා පනත (**"FCPA"**) ද ඇතුළත්ව නමුත් ඊට සීමා නොවී, අදාළ වන අල්ලස් වැළැක්වීමේ නීති කඩවීමක් සිදුවන ආකාරයේ ක්‍රියාවක් ගනුදෙනුකරු හෝ ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තෙකු හෝ සෘජුව හෝ වක්‍ර ලෙස සිදුකර නොමැති අතර එවැන්නක් සම්බන්ධයෙන් එම තැනැත්තා දැනුවත් ව නොසිටී. තවද, ගනුදෙනුකරු විසින් ඔහුගේ /ඇයගේ ව්‍යාපාර කටයුතු එක්සත් රාජධානි අල්ලස් පනතට සහ එක්සත් ජනපද විදේශ දූෂණ ක්‍රියා පනතට සහ ඊට සමාන නීති, රීති හෝ රෙගුලාසි අනුකූලව සිදුකර ඇති අතර,

අඛණ්ඩව ඊට අනුකූලව පැවතීම සහතික වනු පිණිස සහ අඛණ්ඩව සහතික වෙතැයි අපේක්ෂා කෙරෙන ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි ස්ථාපිත කර පවත්වාගෙන යනු ලැබේ.

අදාළ කිසිදු අල්ලස් වැළැක්වීමේ නීතියක් උල්ලංඝණය වීමක් සිදුවන අකාරයෙන් කිසිදු ගෙවීමක් සිදුකිරීමට ගිණුම් හෝ සේවාවන් කිසිවක් සෘජුව හෝ වක්‍ර ලෙස භාවිත නොකෙරෙන බවට ගනුදෙනුකරු භාරගනියි.

22.7.4 ගනුදෙනුකරු සෑම අවස්ථාවක දී ම අදාළ මූල්‍ය වාර්තා තබාගැනීම සහ වාර්තා කිරීමේ නියමයන්ට සහ මුදල් විශුද්ධිකරණ පනත් හා ඒ යටතේ පවතින රීති සහ රෙගුලාසි වලට සහ, ගනුදෙනුකරු හෝ එහි අනුබද්ධ ආයතන මත බලය ඇති රජයේ යම් ආයතනයක් විසින් නිකුත් කළ, පනවන ලද හෝ බලාත්මක කරන ලද ඊට අදාළ හෝ ඊට සමාන රීති, රෙගුලාසි හෝ මගපෙන්වීම් වලට (සමස්තයක් ලෙස "**මුදල් විශුද්ධිකරණ නීති**") අනුකූලව ක්‍රියා කරන බවට සහතික වන අතර, යම් අධිකරණයක් හෝ රජයේ ආයතනයක්, අධිකාරියක් හෝ ගනුදෙනුකරුට, නියෝජිතයෙකුට හෝ සේවකයන්ට සම්බන්ධ යම් බේරුම්කරුවකු විසින් හෝ ඒ ඉදිරියේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් කිසිදු නඩුවක්, නඩු කටයුත්තක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් නොපවතින බවට හෝ, සිය උපරිම දැනීමට අනුව එවැන්නක් සිදුවීමේ අවදානමක් නොමැති බවට සහතික වේ.

22.8 නීතිරීති හා රෙගුලාසි වලට සහ කලින් කලට බලපැවැත්වෙන ප්‍රතිපත්ති වලට අනුකූලව බැංකුව විසින් නිකුත් කළ ඩෙබිට් කාඩ්පත් භාවිත කර ගිණුම් හිමියා/හිමියන් විසින් සත්‍යාසන්න මුදල්, ක්‍රිප්ටෝ මුදල්, බිට්කොයින් මිලදී ගැනීම, විකිණීම සහ භාවිත කිරීම හෝ/සහ ෆොරෙක්ස් අලෙවියෙහි නිරත වීම, ප්‍රාග්ධන ගනුදෙනු සහ විදේශ මුදල් හුවමාරුව ද ඇතුළත්ව, නමුත් ඊට සීමා නොවී එවැනි ගනුදෙනුවල නිරත නොවිය යුතුය.

ගිණුම් හිමියා/හිමියන් විසින් පුණ්‍ය කටයුතු සඳහා මුදල්/ පරිත්‍යාග ඇතුළුව නමුත් ඊට සීමා නොවී ලාභ-සඳහා නොවන ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ වෙනත් පුණ්‍යායතන වෙති මුදල්/පරිත්‍යාග භාර ගැනීමට පෞද්ගලික ගිණුම/ගිණුම් භාවිත නොකළ යුතුය. පෞද්ගලික ගිණුම/ගිණුම් භාවිත කළ යුත්තේ පෞද්ගලික ස්වභාවයේ ගනුදෙනු සිදුකිරීමට පමණක් වන අතර, නීතිරීති හා රෙගුලාසි වලට සහ කලින් කලට බලපැවැත්වෙන ප්‍රතිපත්ති වලට අනුකූලව පෞද්ගලික ගිණුම/ගිණුම් භාවිත කර ව්‍යාපාරික ගනුදෙනු සිදුකළ නොහැක.



PUBLIC

## 23. දත්ත ආරක්ෂාව

23.1 දේශීය බලප්‍රදේශයේ හෝ විදේශයක දත්ත ආරක්ෂක ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියාකරන අවස්ථාවක දී සියලුම HSBC සමූහ සාමාජිකයින්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හා තෙවන පාර්ශ්වයන් යටත් වන දැඩි රහස්‍ය හා ආරක්ෂක ආචාරධර්ම පද්ධතියක් මගින් පාරිභෝගික තොරතුරු ආරක්ෂා කෙරෙනු ඇත.

## 24. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්

24.1 මූල්‍ය අපරාධ නිරීක්ෂණය, විමර්ශනය හා වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ඇති නීති රෙගුලාසි සම්බාධක රෙජීමයන්, ජාත්‍යන්තර මගපෙන්වුම්, HSBC සමූහයේ අභ්‍යන්තර ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සහ/හෝ යම් බලධාරියෙකු වෙතින් ලැබෙන ඉල්ලීම් වලට අනුකූලව ක්‍රියා කිරීමට HSBC සහ HSBC සමූහයේ යම් සාමාජිකයන් (සිය තනි හා පූර්ණ අභිමතය යටතේ) සුදුසු යැයි සිතන යම් පියවර ගත යුතු වන අතර, එසේ පියවර ගනු ඇත. ("මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකරකම්").

එම පියවර වලට, (a) යම් උපදෙසක්, සන්නිවේදනයක්, මුදල් ඉපදවීමේ ඉල්ලීමක්, සේවාවන් සඳහා අයදුම් කිරීමක් හෝ ගනුදෙනුකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යවන ලද හෝ ලබන යම් ගෙවීමක් නිරීක්ෂණය, හසුකරගැනීම හා විමර්ශනය කිරීම (b) අරමුදල්වල මූලාශ්‍රය හෝ අරමුණු කරන ලද ලැබුම්කරුවන් පිළිබඳව විමර්ශනය කිරීම (c) පාරිභෝගික තොරතුරු HSBC සමූහය සතු අනෙකුත් අදාළ තොරතුරු හා සම්බන්ධ කිරීම සහ/හෝ (d) ඇතැම් පුද්ගලයෙකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් ඔවුන් සම්බාධක රෙජීමයකට යටත් වන්නේදැයි වැඩිදුර විමසීම හා ගනුදෙනුකරුගේ අනන්‍යතාව හා තත්ත්වය තහවුරුකරගැනීම ඇතුළත් විය හැකි නමුත්, ඊට සීමා නොවේ.

24.2 ව්‍යාතිරේක ලෙස, HSBC විසින් මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් භාරගැනීම මගින් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිෂ්කාශනය, පාරිභෝගික උපදෙස් සැකසුම හෝ සේවාවන් සඳහා අයදුම් කිරීම හෝ සේවාවන් සියල්ල හෝ එයින් කොටසක් සැපයීම ප්‍රමාද වීම, අවහිර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුවිය හැක. නීතියෙන් අවසර ඇති ප්‍රමාණයට, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කිසියම් ආකාරයකින් ගනුදෙනුකරුට හෝ තෙවන පාර්ශ්වයකට පැන නගින, විඳින්නට හෝ දරන්නට සිදුවන යම් අලාභයක් සඳහා HSBC හෝ HSBC සමූහයේ යම්

සාමාජිකයෙකු ගනුදෙනුකරු වෙත හෝ යම් තෙවන පාර්ශ්වයක් වෙත වගකීමට ලක් නොවනු ඇත.

## 25. බදු අනුකූලතාව

අදාළ බැඳීම් පැන නගින සහ අප විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයින් විසින් සපයන ගිණුම (ගිණුම්) හෝ සේවාවන් විවෘත කිරීමට අදාළව සියලුම බලප්‍රදේශයන් තුළ දී ඔබගේ බදු බැඳීම් (බදු ගෙවීම හෝ අදාළ සියලු බදු ගෙවීම සම්බන්ධයෙන් ඇති ලේඛන හෝ වෙනත් දෑ සම්පූර්ණ කිරීම සහ භාරදීම ද ඇතුළත් ව) වටහාගැනීම හා ඊට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ඔබ සම්පූර්ණයෙන් වගකිව යුතු වන බව HSBC විසින් පිළිගනියි. සෑම සම්බන්ධිත තැනැත්තෙකුම (සිය පෞද්ගලික තත්ත්වයෙන් නොව) සම්බන්ධිත තැනැත්තෙකුගේ තත්ත්වයෙන් ක්‍රියාකරමින් තමන් සම්බන්ධයෙන් එම පිළිගැනීම ම සිදුකරයි. සම්බන්ධිත තැනැත්තාගේ හෝ ඔබගේ වාසභූමිය, නේවාසික ස්ථානය, පුරවැසි භාවය හෝ සංස්ථාපිත කිරීම නොසලකා, සමහර රටවල දේශසීමාවෙන් බාහිර බලපෑම් සහිත බදු ව්‍යවස්ථාවන් පැවතිය හැක. අප හෝ HSBC සමූහයේ කිසිදු සාමාජිකයෙකු විසින් බදු උපදේශනය සපයනු නොලැබේ. ස්වාධීන නීතිමය හා බදු උපදෙස් සපයා ගන්නා ලෙස ඔබට උපදෙස් දෙමු. ගිණුම (ගිණුම්) විවෘත කිරීම හා භාවිත කිරීම සහ අප විසින් හෝ HSBC සමූහයේ සාමාජිකයින් විසින් සපයනු ඇති සේවාවන් සම්බන්ධයෙන් විශේෂයෙන් අදාළ වන බැඳීම් ද ඇතුළත්ව කිසිදු බලප්‍රදේශයක පැන නගිනු ඇති ඔබගේ බදු බැඳීම් සම්බන්ධයෙන් අප හෝ HSBC සමූහයේ කිසිදු සාමාජිකයෙකු වෙත වගකීමක් නොමැත.

## 26. ලියම සහ පියවා ගැනීම සඳහා බැංකුවට ඇති අයිතිය

අගති විරහිතව සහ කිසියම් හෝ ගිණුමක් මත බැංකුවට ඇති යම් ලියමක්, හිලව් කිරීමක් හෝ සුරැකුමක් මත ඇති වෙනත් අයිතියකට අමතරව, මුල් මුදල හෝ ඇපය ලෙස, තථ්‍ය හෝ අනුමිත ලෙස, මූලික හෝ සුරැකුම් ලෙස, තනිව හෝ වෙනත් අයකු සමග බද්ධව ගිණුම් හිමියාගේ/හිමියන්ගේ වගකීම් වෙනුවෙන් කිසියම් ගිණුමක/ගිණුම්වල බැරව ඇති මුදලක් හෝ සියලු මුදල් හිලව් කිරීමට සහ තනි ව හෝ වෙනත් ඕනෑම අයෙකු සමග බද්ධව බැංකුව සමග ඇති වගකීම් සහ ඕනෑම ගිණුමක් හෝ සියලු ගිණුම් ඕනෑම අවස්ථාවක හෝ කලින් කලට ඒකාබද්ධ කිරීමට හෝ සංයුක්ත කිරීමට හැකි බවට පවත්නා බැංකු විනිමය අනුපාතිකය යටතේ අවශ්‍ය ඕනෑම ව්‍යවහාර මුදල් පරිවර්තනයක් කිරීමට බැංකුවට හැකි බවට ගිණුම් හිමියා/හිමියෝ එකඟ වේ.

මෙම වගන්තිය යටතේ බැංකුවේ අයිතිවාසිකම් ගිණුම් හිමියා/හිමියන්ගේ මරණය, බුන්වත්භාවය හෝ නෛතික අශක්නුතාවයක් හේතුවෙන් බලපෑමට ලක් නොවනු ඇත.

## 27. බද්ධ ගිණුම්

27.1 මෙහි සඳහන් වෙනත් සියලු නියමයන්ට අමතරව, ගිණුම් හිමියා/හිමියන් පහත සඳහන් දෑ පිළිබඳව සම්පූර්ණයෙන් දැනුවත් බවට ගිණුම් හිමියා/හිමියන් ප්‍රකාශ කරයිඃ

27.1.1 ගිණුම් හිමියා බවට පත්වන යම් අයෙකු මියගිය අවස්ථාවක දී, එකී බද්ධ ගිණුමෙහි බැරට පවතින මුදල් ජීවත්ව සිටින ගිණුම් හිමියා හෝ ගිණුම් හිමියන් වෙත ගෙවනු ඇති අතර, බැංකුවට පිළිගත හැකි නිසි සාක්ෂි සමග මරණය පිළිබඳව නිසි දැනුම්දීමක් ලබාදෙන තෙක්,

බැංකුව විසින් මෙහෙයුම් උපදෙස් අනුව මුදල් ගෙවීම සම්බන්ධයෙන් කිසිදු හවුල් ගිණුම් හිමියකු විසින් බැංකුව වගකීමට ලක් නොකෙරෙයි;

27.1.2 හවුල් ගිණුමක ගිණුම් හිමියන්ගෙන් කිසිවකු මියගිය බවට දැනුම්දීම ලැබුණු වහාම, එකී මියගිය අයට අයත් ගිණුම හෝ ගිණුම් සම්බන්ධයෙන් බැංකුවෙහි බැරට හෝ බැංකුව විසින් රඳවාගෙන ගෙන ඇති සියලු මුදල්, ආරක්ෂණ, ඔප්පු, ලේඛන සහ වෙනත් ඕනෑම දේපලක් බැංකුව විසින් ජීවත්ව සිටින හවුල් ගිණුම් හිමියන් වෙත කරනු ලබන ගෙවීම් හෝ බෙදාහැරීම් හෝ සම්බන්ධයෙන් බැංකුවෙහි පූර්ණ වගකීම ඉටු කරනු ඇති බවට එක් එක් හවුල් ගිණුම් හිමියා විසින් එකඟ වේ;

27.1.3 ගිණුම මත හෝ වෙනත් ආකාරයකට පැන නගින අයිරාවක් හෝ වෙනත් බැඳීම්, එක් එක් හා වෙන් වෙන් ව සෑම බද්ධ ගිණුම් හිමියකුගේ ම වගකීමක් වන බවට ද;

27.1.4 කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් හවුල් ගිණුම් හිමියන්ගෙන් එක් හෝ ඊට වැඩි ගණනකගේ (නමුත් සියල්ලන් ම නොව) කිසියම් වෙනසක් හෝ මෙහි හවුල් ගිණුම් හිමියන් කිසිවෙකුගේ බලය අහෝසි කිරීමක් සිදුවුවහොත්, සහ/හෝ හවුල් ගිණුම් හිමියන් අතර වන කිසියම් මතභේදයක් සම්බන්ධයෙන් බැංකුව දැනුවත් කරනු ලැබුවහොත්, හවුල් ගිණුම් හිමියන් විසින් බැංකුව වෙත ලබාදී ඇති අත්සන් කිරීමේ උපදෙස්වල කුමක් සඳහන් වුවද, බැංකුව සිය පරම අභිමතය පරිදි, ඉන් අනතුරුව සියලු හවුල් ගිණුම් හිමියන් විසින් හවුල් ව එකී ගිණුම මෙහෙයවීම අවශ්‍ය කෙරෙනු ඇති බවට තීරණය කෙරෙනු ඇත.

27.1.5 එක් එක් ගිණුම් හිමියකු විසින් වෙනත් ගිණුම් හිමියකු (හවුල් අත්සන්කරු/අත්සන්කරුවන්) සමග ගිණුමක් හෝ සේවාවක් හෝ හවුලේ භාවිත කරන්නේ නම්, ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන එක් එක් ගිණුම් යටතේ පවතින බැඳීම් සහ වගකීම් සඳහා සහ ඔවුන් විසින් භාවිත

කරනු ලබන සෑම සේවාවක් සඳහා ම මෙම නීතිරීති හා කොන්දේසි යටතේ එකී සෑම හවුල් අත්සන්කරුවකු ම එක් ව සහ වෙන් වෙන් ව වගකිව යුතු වේ.

27.1.6 ගිණුමක් තනිව මෙහෙය වීමට හවුල් අත්සන්කරුට අවසර දී ඇත්නම්, එකී ගිණුම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ (බැංකුව විසින් වෙනත් ආකාරයකට තීරණය නොකරන්නේ නම්) එම හවුල් අත්සන්කරු විසින් ලබා දෙන උපදෙස් හෝ විධානයන්ට අනුව බැංකුව විසින් කටයුතු කරනු ඇත.

27.1.7 යම් හවුල් අත්සන්කරුවකු විසින් මෙම නීතිරීති හා කොන්දේසි පිළිගනු ලැබීමෙන් පසු, අනෙකුත් සෑම හවුල් අත්සන්කරුවකු ම මෙම නීතිරීති හා කොන්දේසි මගින් බැඳී සිටිනු ඇත.

27.1.8 පහත දැක්වෙන දුර්වලතා පැවතියේ වුවද, ඒවා සම්බන්ධයෙන් බැංකුව දැන සිටියේ හෝ දැන සිටිය යුතු වූයේ වුවද නොවුවද, සෑම හවුල් අත්සන්කරුවකු ම මෙම නීතිරීති හා කොන්දේසි සහ අදාළ ගිණුම හෝ සේවාව හෝ පාලනය වන වෙනත් නීතිරීති හා කොන්දේසි මගින් බැඳී සිටිනු ඇතඃ

a) හවුල් අත්සන්කරුවකු මෙම නීතිරීති හා කොන්දේසි මගින් හෝ වෙනත් නීතිරීති හා කොන්දේසි මගින් හෝ බැඳී සිටීමට අරමුණු කරන ලද නමුත් ඇත්ත වශයෙන්ම බැඳී නොසිටීම; හෝ,

b) මෙම නීතිරීති සහ කොන්දේසි හෝ වෙනත් යම් නීතිරීති හා කොන්දේසි කිසිවක් හෝ අවලංගු වීම හෝ හවුල් අත්සන්කරුවකුට එරෙහිව බලාත්මක කළ නොහැකි වීම.

27.1.9 තවත් හවුල් අත්සන්කරුවකුට එරෙහිව බැංකුවේ අයිතීන්, බලතල හා ප්‍රතිකර්ම සීමා කිරීමෙන් හෝ අඩු කිරීමකින් තොරව, බැංකුව විසින් ඕනෑම හවුල් අත්සන්කරුවකුට එරෙහිව වෙන වෙන ම ක්‍රියා කරනු ඇත. උදාහරණයක් ලෙස මෙයට පහත දැක්වෙන දෑ අතරින් එකක් ඇතුළත් වනු ඇතඃ

a) වගකීම යම් ප්‍රමාණයකට වෙනස් කිරීම හෝ වගකීමෙන් නිදහස් කිරීම; හෝ

b) කාලය ලබාදීම හෝ වෙනත් පහසුවක් සැලසීම හෝ වෙනත් අයුරින් කටයුතු සූදානම් කිරීම.

27.1.10මෙම නීතිරීති හා කොන්දේසි යටතේ යම් හවුල් අත්සන්කරුවකු වෙත සිදු කරන යම් දැන්වීමක් සියලු හවුල් අත්සන්කරුවන් වෙත නිසි පරිදි සිදු කරන ලද දැන්වීමක් ලෙස සැලකෙනු ඇත.

27.1.11සියලුම හවුල් අත්සන්කරුවන් වෙත පහත දෑ හෙළිදරවු කිරීමට බැංකුවට බලය ඇතඃ

a) ගිණුමක් පිළිබඳ ඕනෑම තොරතුරක් - හවුල් අත්සන්කරුවන්ගේ හවුල් නාමයන්ගෙන් ගිණුම පවත්වා නොගන්නා ලද කාලසීමාවකට මෙය අදාළ විය හැකිය; සහ

b) යම් හවුල් අත්සන්කරුවකුට අදාළ වූ හෝ සපයන ලද්දා වූ යම් පෞද්ගලික දත්ත සහ වෙනත් තොරතුරු.

**පොදු විධිවිධාන**

28. බැංකුව විසින් භාරයන් පිළිනොගනී.

29. ක්ෂුද්‍ර පටිගතකිරීම් (micro filming) වලින් අනතුරුව ගිණුමට සම්බන්ධ ඕනෑම ලේඛනයක් බැංකුව විසින් සිය අභිමතය පරිදි විනාශ කර දමනු ඇත.

අධිකාරීන් විසින් මුදල් ආපසු ගැනීම් සහ පොලී ගෙවීම් මත සීමා පනවනු ලබන අවස්ථාවන් හි දී ගිණුම් හිමියා/හිමියන් එවැනි සීමා පැනවීම් වලින් බැඳී සිටියි.

30. බැංකුව වෙත ලබා දුන් සියලු තොරතුරු (ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතක හෝ වෙනත් ආකාරයකින් හෝ) ගිණුම් හිමියා/හිමියන්ගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ගිණුම් හිමියා/හිමියන් ප්‍රතිඥා දෙයි.

31. කිසියම් අලෙවිකරණ තොරතුරු හෝ විශේෂ ප්‍රවර්ධන පිරිනැමීම් සම්බන්ධයෙන් ගිණුම් හිමියා වෙත දැනුම්දීම සඳහා කෙටි පණිවුඩ, PIB හෝ නම්කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයක් හෝ හරහා ගිණුම් හිමියා සමඟ සන්නිවේදනය කිරීමට ගිණුම් හිමියා විසින් බැංකුවට බලය පවරනු ලබයි.

32. බැංකුව විසින් ගිණුම්වල දැක්වෙන ප්‍රකාශන, වවුචර, ආපසුගැනීම්/තැන්පතු පත්‍රිකා, චෙක්පත් හෝ වෙනත් ඕනෑම ගනුදෙනු වාර්තාවල පිටපත් තබාගනු ඇත්තේ වසර 7ක කාලසීමාවක් සඳහා පමණකි. එවැනි සෑම වාර්තාවක් ම වසර 7කට පසුව විනාශ කරනු ඇති අතර, වසර 7ක ට පසුව ප්‍රකාශනවල හෝ ගනුදෙනු වාර්තාවල පිටපත් සැපයීම සඳහා කිසිදු වගකීමක් හෝ වගවීමක් බැංකුව විසින් භාර නොගනී.

33. ගිණුම් හිමියා/හිමියන් විසින් යම් ගිණුමක් (නිත්‍ය උපදෙස් ඇතුළත්ව) හර කරමින් ගෙවීම් සිදුකරන ලෙසට බැංකුවේ ශාඛාවන් වෙත තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීම මගින් බැංකුව වෙත ලබාදෙන සහතික කළ උපදෙස් මත පමණක් ලද බැංකුව විසින් ක්‍රියාකරනු ඇත. නියමිත කාල වකවානුවක් තුළ එකී උපදෙස් මත ක්‍රියා කිරීමට අපොහොසත් වීම තුළින් පැන නගින කිසියම් හෝ වන්දි, පාඩු හෝ වියදම් පිළිබඳව බැංකුව වගවීමට හෝ වගකීමට ලක් කල නොහැක.

34. මුදල් තැන්පතු, මුදල් හෝ චෙක්පත් ආපසුගැනීම්, චෙක්පත් තැන්පතු හා වෙනත් හර/බැර ගනුදෙනු සම්බන්ධව, බැංකුවේ තනි අභිමතය පරිදි එසේ කළහොත් හැර, බැංකුව විසින් වෙන වෙන ම තැපෑලෙන් ගිණුම් හිමියන් වෙත පත්‍රිකා නොඑවනු ඇත.

35. මෙම නීතිරීතිවල සහ වෙනත් යම් සේවාවක, සැලසුමක, ව්‍යාපාරික සම්බන්ධතාවක, ගිණුමක, හෝ ගිණුම් හිමියා/හිමියන් හා බැංකුව අතර ඇති ගිවිසුමක ඇති කිසිවක් අතර කිසියම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇතිවන අවස්ථාවක දී, මෙම නීතිරීති බලාත්මකව පවතිනු ඇත. පාරිභෝගික තොරතුරු සම්බන්ධයෙන් ගිණුම් හිමියා/හිමියන් වෙතින් ලැබී ඇති දැනටමත් පවතින යම් කැමැත්ත පළකිරීමක්, බලය දීමක්, බැංකුව විසින් ඉල්ලා සිටි අයිතීන් අතහැරීමක් හා අවසර දීමක් අදාළ දේශීය නීතිය මගින් අවසර ලැබෙන ප්‍රමාණයට පූර්ණ බලය සහ බලපැවැත්වීම සහිතව අඛණ්ඩව අදාළ වනු ඇත.

35.1 කිසියම් ආකාරයකින් යම් බලප්‍රදේශයක නීතිය යටතේ මෙම නීතිරීතිවල ඇති ප්‍රතිපාදන සියල්ලම හෝ ඉන් කොටසක් හෝ නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වුවහොත් එමගින් වෙනත් යම් බලප්‍රදේශයක එම ප්‍රතිපාදනවල හෝ එම බලප්‍රදේශයේ මෙම නීතිරීති වලින් ඉතිරියෙහි නීත්‍යානුකූල භාවයට, වලංගුතාවට හෝ බලාත්මක කළ හැකි බවට බලපෑමක් හෝ හානියක් සිදු නොවනු ඇත.

35.2 මේ යටතේ තැපෑලෙන් යවනු ලබන යම් දැන්වීමක් බැංකුව වෙත අවසන් වරට ලිඛිතව දැනුම් දී ඇති ලිපිනයට තැපැල් කිරීමෙන් පසු වැඩකරන දින 07ක් තුළ ගිණුම් හිමියා/හිමියන් වෙත ලැබී ඇති බවට සැලකෙනු ඇත.

35.3 මේ යටතේ පවතින යම් අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාත්මක කිරීමේ දී බැංකුව වෙතින් සිදුවන ඉවසීමක්, අපොහොසත් වීමක්, ප්‍රමාදයක් හෝ අතහැර දැමීමක් මගින් එය අතහැර දැමීමක් සිදු නොවන අතර, තනි හෝ අර්ධ වශයෙන් ක්‍රියාත්මක කිරීමක් මගින් එය තවත් හෝ වැඩිදුරටත් ක්‍රියාත්මක කිරීම හෝ අනෙක් යම් අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාත්මක කිරීම වැළැක්වීමක් සිදු නොවේ. මෙහි බැංකුව වෙත ලබා දී ඇති ප්‍රතිකර්මයන් මගින් අනෙක් ප්‍රතිකර්ම බැහැර කිරීමක් අදහස් නොවන අතර, එක් එක් සහ සෑම ප්‍රතිකර්මයක් ම එකිනෙකට අනුපූරක වනු ඇති අතර, ඒවා මේ යටතේ හෝ දැනට හෝ මින් මතුවට නීතියෙන් හෝ සාධාරණත්වයෙන් හෝ ව්‍යවස්ථාවකින් හෝ වෙනත් ආකාරයකින් හෝ පවතින වෙනත් යම් ප්‍රතිකර්මයකට අමතරව වනු ඇත.



PUBLIC

36. සේවාවන් සම්බන්ධයෙන් හෝ ගිණුමක් සම්බන්ධයෙන් හෝ බැංකුව වෙත ගෙවිය යුතු වන හෝ බැංකුව විසින් ලැබිය යුතු වන (ගාස්තු, පිරිවැය, පොලී සහ වියදම් ද ඇතුළත්ව) සියලුම ගෙවීම් හෝ මුදල් කලින් කලට අදාළ වනු ඇති බදු රහිතව වේ. බැංකුව වෙත ගෙවිය යුතු වන හෝ බැංකුව විසින් ලැබිය යුතු වන සියලුම ගෙවීම් හෝ මුදල්, බදු ගෙවීම් හෝ වර්තමාන හෝ අනාගත බදු හෝ අයකිරීම් සඳහා වන ඊට සමාන අයකිරීම් සම්බන්ධයෙන් සිදුවන අඩුකිරීම් හෝ රඳවාගැනීම් හෝ ගෙවීම් රහිතව සහ නිදහස් ව පවතී. බදු හෝ ඊට සමාන අයකිරීම් සම්බන්ධයෙන් සිදුවන අඩුකිරීම් හෝ රඳවාගැනීම් හෝ ගෙවීම්, අදාළ නීතිරීති හෝ රෙගුලාසි මගින් නියම කර ඇති විට, බදු හෝ ඊට සමාන අයකිරීමක් සඳහා එවැනි අඩුකිරීමක් හෝ රඳවාගැනීමක් හෝ ගෙවීමක් නියම කර නොපැවතියේ නම්, බැංකුව විසින් ලැබිය යුතුව තිබූ සම්පූර්ණ මුදල බැංකුව විසින් ලබන බවට සහතික වීම සඳහා ගිණුම් හිමියා/හිමියන් විසින් බැංකුව වෙත සිදුකරන ගෙවීම ඉහළ දැමීම හෝ බැංකුව වෙත අතිරේක මුදලක් ගෙවීම හෝ කළ යුතුය. ගනුදෙනුකරු විසින් අදාළ අඩුකිරීම් හෝ රඳවාගැනීම් හෝ ගෙවීම් පිළිබඳ වගකීම් වලට අනුකූලතාව දක්වා ඇති බවට බැංකුවේ ඉල්ලීම මත ගනුදෙනුකරු විසින් බැංකුව සෑහීමකට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අධිකාරීන් විසින් බැංකුවට එරෙහිව සිදු කළ හැකි යම් අයැදීමක් ද ඇතුළත්ව, එවැනි වගකීම් වලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීමෙන් ඇතිවන සියලුම ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව හානි වලින් මුක්ත කිරීමට සහ ඉල්ලූ විටෙක සම්පූර්ණයෙන් හානිපූරණය කිරීමට එකඟ වේ.

37. සේවාවන් සම්බන්ධයෙන් හෝ ගිණුමක් සම්බන්ධයෙන් ඊට අදාළව දරන්නට සිදුවන පොලී, දඩ, පිරිවැය හෝ වියදම් ද ඇතුළත්ව, අය කෙරෙන බදු සඳහා හෝ ඒ වෙනුවෙන් දරන්නට සිදුවන හෝ සිදුවනු ඇතැයි (ඍජුව හෝ වක්‍ර ලෙස) බැංකුව විසින් තීරණය කරන හෝ යම් පාඩුවක්, වගකීමක් හෝ පිරිවැයක් සම්බන්ධයෙන් බැංකුව හානිපූරණය කර සහ ඊට සමාන මුදලක් ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතුය.

38. සේවාවන් සැපයීම හෝ මෙම නීතිරීති හා කොන්දේසි ක්‍රියාත්මක කිරීම සහ බැංකුව වෙත ලැබිය යුතු හෝ ඕනෑම ආකාරයක නීතිමය ක්‍රියාමාර්ගයක් සඳහා බැංකුව විසින් දරන ලද යම් මුදලක් අයකරගැනීමට අදාළව ඕනෑම ආකාරයකින් පැනනගින සියලුම පිරිවැය සහ වියදම් (නීතිමය ගාස්තු ද ඇතුළත්ව) සඳහා බැංකුව සම්පූර්ණයෙන් හානිපූරණය කිරීමට ගිණුම් හිමියා/හිමියන් එකඟ වේ.

39. ගිණුම් හිමියා/හිමියන්ගේ එකඟතාව නොමැතිව, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක ස්වකීය අයිතීන් හෝ වගකීම් සියල්ලම හෝ කිසිවක් යම් තැනැත්තෙකු වෙත පැවරීම හෝ මාරු කිරීම සිදුකළ

හැකිය. බැංකුවේ ලිඛිත එකඟතාව නොමැතිව ගිණුම් හිමියා/හිමියන්ට ස්වකීය අයිතීන් හෝ වගකීම් කිසිවක් වෙනත් තැනැත්තෙකු වෙත පැවරීමට හෝ මාරු කිරීමට හෝ අවසර නොමැත.

40. පාලනයෙන් බැහැර සිදුවීම් - විදුලි සංදේශ, දත්ත සන්නිවේදන සහ පරිගණක පද්ධති හා සේවා වල බිඳවැටීමක්, දෝෂයක් හෝ අවහිර වීමක්, යුද්ධය, සිවිල් කෝලාහල, රජයේ ක්‍රියාමාර්ග, වැඩවර්ජන, සේවයෙන් ඉවත්වීම් හෝ වෙනත් කම්කරු ක්‍රියාමාර්ග හෝ ව්‍යාපාර මතභේද (දෙපාර්ශ්වයේ සේවකයන් හෝ තෙවන පාර්ශ්වයක සේවකයන් සම්බන්ධයෙන් වුවද) නිසා සිදුවන, සාධාරණ පරිදි ස්වකීය පාලනයෙන් බැහැර තත්ත්වයන් හේතුවෙන් ඇතිවන, මෙම නීතිරීති හා කොන්දේසි යටතේ පාර්ශ්වයන්ට පවතින වගකීම් කිසිවක් ඉටුකිරීමට ප්‍රමාදවීම හෝ ඉටුකිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වයම වගකිව යුතු නොවේ. මේ ආකාරයේ යම් ප්‍රමාදයක් හෝ අපොහොසත් වීමක් මෙම කොන්දේසි කඩකිරීමක් ලෙස නොසැලකෙනු ඇති අතර, අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි සැලකෙන කාලසීමාවකින් බලපෑම් ලත් වගකීම ඉටුකිරීමේ කාලසීමාව දීර්ඝ කෙරෙනු ඇත.

41. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සැලසුම (SLDIS) යනු මූල්‍ය ආයතන වල බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හේතුවෙන් මූල්‍ය ආයතන වල තැන්පතුකරුවන් හට සිදුවන පාඩු සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ මූල්‍ය ආයතන වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රණයකි. ද හොංකොං ඇන්ඩ් ෂැංග්හායි බැන්කින් කෝර්පරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ශාඛාව / HSBC යනු, SLDIS හි සාමාජික ආයතනයකි. එබැවින්, කලින් කලට CBSL විසින් තීරණය කරනු ඇති සහ SLDIS විසින් දක්වනු ලබන ආවරණය ගණනය කරනු ලබන ක්‍රමවේදයකට අනුව ගණනය කරනු ලබන උපරිම මුදල ශ්‍රීලංරු.1,100,000/-ක් දක්වා වන්දි ගෙවීමක් ඉල්ලුම් තැන්පතුවක්/තැන්පතු, කාල තැන්පතුවක්/ තැන්පතු හෝ ඉතුරුම් තැන්පතුවක්/ තැන්පතු හිමි කරගැනීමට සුදුසුකම් ලබන එක් එක් ගිණුම් හිමියකු වෙත ලැබෙනු ඇත. හවුල් ගිණුම් හිමියෙකු සම්බන්ධයෙන් වනවිට, සුදුසුකම් ලබන එක් එක් හවුල් ගිණුම් හිමියා වෙනම තැන්පතුකරුවකු ලෙසට සලකනු ඇති අතර, කලින් කලට CBSL විසින් තීරණය කරනු ඇති පරිදි උපරිම මුදල රු.1,100,000/-ක් දක්වා වන්දි ගෙවීමක් ඔහු/ඇය වෙත ලැබෙනු ඇත. කලින් කලට යාවත්කාලීන කළ හැකි හෝ සංශෝධනය විය හැකි SLDIS පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර www.cbsl.gov.lk/sri-lanka-deposit-insurance-scheme බලන්න.

42. බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අනුකූල වීම පිණිස, ගිණුම් හිමියකු/ගිණුම් හිමියන් විසින් හර ගනුදෙනු ආරම්භ කර නොමැති (අඛණ්ඩව මාස 12ක කාලසීමාවක් සඳහා) ඕනෑම ගිණුමක්/ගිණුම් 'අක්‍රීය' ලෙස වර්ගීකරණය කෙරෙනු ඇත. ගිණුමෙහි තත්ත්වය අක්‍රීය තත්ත්වය ලෙසට වෙනස්

වීමෙන් පසු, ගිණුමෙහි/ගිණුම් වල ඩෙබිට් කාඩ්පත/කාඩ්පත් සහ/හෝ **ATM** කාඩ්පත, දුරකථන බැංකුකරණ සහ **PIB** පහසුකම් අක්‍රීය කෙරෙනු ඇත.

43. **අවසන් කිරීමෙන් පසු පැවැත්ම**

මෙම නීතිරීති ඒවා අවසන් කිරීමෙන් පසුව ද, HSBC හෝ HSBC සමූහයෙහි සාමාජිකයෙකු විසින් හෝ ගනුදෙනුකරු වෙත යම් සේවාවන් සැපයීම අවසන් කිරීමකින් හෝ යම් පාරිභෝගික ගිණුමක් වසා දැමීමෙන් පසුව ද අඛණ්ඩව අදාළ වනු ඇත.

**මෙම නීතිරීති සංශෝධනය කිරීම**

44. මෙම නීතිරීති රටෙහි අදාළ අවස්ථාවේ බලාත්මකව පවතින නීති මගින් ස්වයංක්‍රීයවම පාලනය වන අතර, ඊට අනුකූලව අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, නීතිය, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ රෙගුලාසි මගින් යම් සංශෝධනයක් අවශ්‍ය කෙරේ නම්, මෙම නීතිරීති ස්වයංක්‍රීයව සංශෝධනය වී පවතිනු ඇත.

45. මෙහි අඩංගු නීතිරීති සහ කොන්දේසි මගින් ගිණුම් හිමියා/ගිණුම් හිමියන් සම්පූර්ණයෙන්ම හා එක සමාන ලෙසට බැඳී සිටිනු ඇත. කෙසේ වෙතත්, මෙම නීතිරීති වලට සිදුකරන යම් සංශෝධන ශාඛාවල දැන්වීම් පුවරුවල සහ/හෝ සියලු ශාඛා වල පොදු ස්ථාන වල සහ බැංකුවේ සීග්‍ර බැංකුකරණ මධ්‍යස්ථාන වල සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.com.lk වෙතින් සහ/හෝ බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙතින් ඉල්ලීමක් කිරීමෙන් පසුව ගිණුම් හිමියා/හිමියන්ට ලබාගැනීමට සහ/හෝ ප්‍රකාශන පණිවිඩයක් මඟින් ලබාගත හැකි අතර, ගිණුම් හිමියා/හිමියන්ට දැනුම්දීමක් ලබාදීමක් ලෙස එය සැලකෙනු ඇත. ගිණුම් හිමියා/හිමියන්ගේ ඉල්ලීම මත නීතිරීතිවල පිටපතක් බැංකුවේ ශාඛාවලින් ලබාගත හැකිවනු ඇත.

46. ගිණුමක් විවෘත කරන හෝ අඛණ්ඩව භාවිතා කරන ඕනෑම තැනැත්තෙකු මෙම නීතිරීති හෝ වෙනත් අදාළ වන නීතිරීති හා කොන්දේසි ද කියවා අවබෝධ කරගෙන ඇති බවට ද එයින් බැඳී සිටින බවට ද සැලකෙනු ඇත. මේ සඳහා වන ප්‍රකාශනයක් එම ගිණුම/ගිණුම් විවෘත කිරීම සම්පූර්ණ කළ යුතු වේ

47. **පාලනය වන නීතිය හා අධිකරණ බලප්‍රදේශය**

මෙම නීතිරීති සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති වලට අනුව අනුකූලව අර්ථනිරූපනය හා බලාත්මක කෙරෙනු ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් වෙනත් බලප්‍රදේශයක අධිකරණ වල සමගාමී අධිකරණ

බලයක් තිබිය හැකිද යන්න නොසලකා, සියලුම ආරවුල් ශ්‍රී ලංකාවේ අධිකරණ වල තනි අධිකරණ බලයට යටත් වේ.

**48. නීතිරීතිවල සංස්කරණය**

මෙම නීතිරීති හා කොන්දේසි සිංහල සහ දමිළ භාෂාවලින් ලබාගත හැකිය. ඉංග්‍රීසි, සිංහල හා දමිළ ලේඛන අතර, යම් පරස්පර විරෝධීතාවක් ඇතිවුවහොත්, ඉංග්‍රීසි සංස්කරණය බලාත්මක වේ.

**49. පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම**

වාචිකව බැංකුව වෙත හෝ ලිඛිතව ළඟම පිහිටි ශාඛාව වෙත හෝ පහත පරිදි බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හෝ ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අයිතිය ගිණුම් හිමියා/හිමියන් සතු වේ:

තැපැල් ලිපිනයඃ කළමනාකරු, පාරිභෝගික අත්දැකීම් සහ සබඳතා, HSBC, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1

Premier විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: premiercustomersolutions@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472272

පුද්ගලික බැංකුකරණ විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: customersolutions@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472200

ක්‍රෙඩිට් කාඩ්පත් විමසීම් සඳහා

විද්‍යුත් තැපැල්: creditcards@hsbc.com.lk

ක්ෂණික ඇමතුම්: +94 114472200

වැඩිදුර සහය සඳහා කරුණාකර https://www.hsbc.lk/help/ බලන්න

- ගිණුම් හිමියා/හිමියන් හට ඕනෑම HSBC බැංකුවේ ඕනෑම ශාඛාවකට පැමිණ එහි බැංකු කළමනාකරු සමඟ කථා කළ හැකිය. නැතිනම්, "ඔබගේ අදහස් වලට සවන්දීම" යන බැංකුවේ ආකෘති පත්‍රය මගින් ගිණුම් හිමියාගේ ප්‍රතිචාර ලබාදිය හැකිය.
- තවද, ගිණුම් හිමියාගේ සබඳතා කළමනාකරුට හෝ බැංකුවේ ශාඛා කාර්යාල මණ්ඩලයේ ඕනෑම අයෙකුට හෝ සෘජුව ම කථා කිරීමේ හැකියාව ද ගිණුම් හිමියා/හිමියන් හට ඇත.

පැමිණිල්ලක් ලද විට, එය ලැබූ පුද්ගලයා විසින් එම පැමිණිල්ල විමසීමට හෝ එහි ඉදිරි පියවර සඳහා බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුව හෝ අංශය වෙත යොමු කළ යුතුය. බැංකුවේ පාරිභෝගික අත්දැකීම් හා සබඳතා අංශය විසින් පැමිණිලි සම්බන්ධව නිරීක්ෂණය සහ පසුවිපරම සිදු කරනු ඇත.

එබඳු පැමිණිල්ලක් ලද දිනයේ සිට සාධාරණ කාලයක් ඇතුළත ගිණුම් හිමියා/හිමියන් විසින් කරන ලද පැමිණිල්ලට බැංකුව විසින් ප්‍රතිචාර දක්වනු ඇත. යම් හෙයින් මෙම කාලසීමාව ඇතුළත පැමිණිල්ල සම්බන්ධව කටයුතු අවසන් කිරීමට නොහැකි වුවහොත්, පැමිණිල්ල පිළිබඳ අවසන් නිගමනයකට එළඹෙන තෙක්, එකී කාලවකවානුව තුළ දී බැංකුව විසින් ගිණුම් හිමියාට අතුරු පිළිතුරක් යවනු ඇත.

යම් හෙයින් පැමිණිල්ල නීත්‍යානුකූල බවට බැංකුව සෑහීමට පත්වන්නේ නම්, පැමිණිල්ල විසඳීමට ගනු ලබන පියවර සිය අවසන් ප්‍රතිචාරය සමග බැංකුව විසින් ගිණුම් හිමියා දැනුම් දෙනු ඇත.

අප වෙත ඉදිරිපත් කරන ගැටලු ගිණුම් හිමියාගේ සම්පූර්ණ සතුටට හේතුවන පරිදි විසඳීමට අප සෑම විටම උත්සාහ කරන අතර, මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත ලියා සහන ඉල්ලා සිටීමට ද ගිණුම් හිමියා/හිමියන් හට හැකිය. 2002 අප්‍රේල් මස ආරම්භ කරන ලද මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ පැකේජයේ එක් කොටසක් වශයෙන් ස්ථාපිත කරන ලද මූල්‍ය සේවා ඔම්බුඩ්ස්මාන් කාර්යාලය යනු ස්වාධීන, අපක්ෂපාතී සහ නොමිලේ සේවාවකි.

මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය - ශ්‍රී ලංකාව,
143ඒ, වජිර පාර, කොළඹ 05
දුරකථනः +94 112 595 624 / +94 112 595 625
ෆැක්ස්ः +94 112 595 625
විද්‍යුත් තැපැලः fosril@sltnet.lk
වෙබ් අඩවියः www.financialombudsman.lk

මෙම නීතිරීති හා කොන්දේසිවල ඉංග්‍රීසි හා දමිළ පරිවර්තන බැංකුවේ වෙබ් අඩවියෙන් (www.hsbc.lk) ද, බැංකුවේ සියලුම කාර්යාල සහ/හෝ ශාඛා කාර්යාල වෙතින් මුද්‍රිත ආකෘතියෙන් ද ලබාගත හැකිය.

**GENAA03-03/2025 (S)**

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා යනු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ වන බලයලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලදී.